කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

2023

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு குடியகல்வுத் திணைக்களம்
Department of Immigration & Emigration

කාර්ය සාධන වාර්තාව
2023

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

"සුහුරුපාය"
ශ්‍රී සුභූතිපුර පාර
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

ප්‍රකාශනය: ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

CM 040341 - 30 (2024/06) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ පණිවිඩය

2023 වර්ෂය ආරම්භය සිදුවන අවස්ථාව වන විට ද ශ්‍රී ලංකාව මෙන්ම ලෝකයේ බොහෝ රටවල පැවති ආර්ථික අර්බුදකාරී තත්වය සක්‍රීයව පැවති සමයක එම අභියෝගයන් පසෙකලා කාර්යක්ෂම ව හා අනලස්ව ජනතා අභිමතාර්ථ සාධනය උදෙසා ක්‍රියාත්මක වූ ප්‍රධානතම ආයතනයක් ලෙස ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ප්‍රධාන තැනක් ගනී. එහි පාලක ජනරාල්වරයා ලෙස 2023 වර්ෂය උදෙසා සැකසූ කාර්ය සාධන වාර්තාවේ, සිදු කළ කාර්යයන් පිළිබඳ අදහසක් ගොනුකිරීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

එවැනි වාතාවරණයක් හමුවේ පෙරටත් වඩා කාර්යක්ෂමතාවයකින් යුතුව ජනතා අභිලාෂයන් ඉටුකර දීමට හැකිවීම හා අපේක්ෂිත ඉලක්කයන් අභිබවා යමින් ජාතික ආදායමට රුපියල් බිලියන 42.8ක දායකත්වයක් ලබා දීමට හැකිවීමත් සතුටින් සිහිපත් කරන අතර එය පසුගිය වසරේ ආදායම හා සලකා බැලීමේදී 79.8%ක වැඩිවීමකි.

විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂම කිරීමේ අරමුණෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ හදිසි ගමන් බලපත්‍ර දින 03 ක් වැනි කාලයක දී හා සාමාන්‍ය ගමන් බලපත්‍ර දින 14ක් වැනි කාලයක දී ද අයදුම්කරුවන් වෙත නිකුත් කිරීමේ ක්‍රමවේදය 2023 වසරේ දී හඳුන්වාදුන් අතර, දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 50ක දායකත්වයෙන් විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් භාරගැනීමට කටයුතු සිදු කිරීමට හැකිවීම පසුගිය වසරේ ලබාගත් ජයග්‍රහණයක් ලෙස සලකමි. එසේම සංචාරකයින්ගේ ආකර්ෂණය ලබා ගැනීමට මාර්ගගත ක්‍රමය ඔස්සේ වීසා අයදුම් කිරීමට නව ක්‍රමවේදයක් (e visa) හඳුන්වාදීමට කටයුතු කිරීම විශේෂ කොට සලකමි.

2023 වසරට ප්‍රවිෂ්ඨ වී ඇති අපගේ දැක්ම, මෙහෙවර හා කාර්යභාරයන් සපුරා ගැනීමට මග පෙන් වූ දෙපාර්තමේන්තුව අයත් වූ අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන්ලා, අමාත්‍යාංශ ලේකම්තුමන්ලා, එම කාර්ය මණ්ඩලයට මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට ද, සහයෝගීව කටයුතු කරනු ලබන දේශීය හා විදේශීය සංවිධාන වලට ද, සේවා සහ පහසුකම් සපයන ආයතන වලට ද, සියලුම සේවාලාභීන්ට ද ස්තුතිය පුදකරනු ලබන අතර විශේෂයෙන් වසර පුරාවට ධාරිතාව ඉක්මවමින් ලද ගමන් බලපත්‍ර ඉල්ලීම් හමුවේ, ඉමහත් කැපවීමකින් අඛණ්ඩ සේවාවක් මහජනතාව වෙත ලබා දීමට ඇප කැප වූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය හා තාවකාලිකව වෙනත් රාජ්‍ය ආයතනවලින් අනුයුක්ත කරගනු ලැබූ නිලධාරීන්ගේ ද සේවය ඇගයීමට මෙය අවස්ථාවක් කොට ගනිමි.

අයි. එස්. එච්. ජේ. ඉළුක්පිටිය
පාලක ජනරාල්,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

පටුන

පිටු අංකය

01 පරිච්ඡේදය-ආයතනික පැතිකඩ 1

1.1 හැඳින්වීම 1

1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන ව්‍යුහය 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන් 4

1.5.1 පාලන අංශය 5

1.5.1.1 පාලන ශාඛාව 5

1.5.1.2 පුහුණු හා සංවර්ධන ශාඛාව 5

1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව 6

1.5.1.4 ප්‍රවාහන ශාඛාව 6

1.5.1.5 සුබසාධන ඒකකය 6

1.5.1.6 මහජන තොරතුරු ඒකකය 6

1.5.1.7 පිළිගැනීමේ කවුළුව 6

1.5.1.8 පියස පරිශ්‍රය 6

1.5.2 ගමන් බලපත්‍ර අංශය 7

1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව 7

1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව 7

1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව 8

1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව 9

1.5.2.5 තැපැල් ශාඛාව 9

1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල 9

1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය 9

1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව 9

1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව 10

1.5.3.3 නීති ශාඛාව 10

1.5.4 වීසා අංශය 12

1.5.5 විමර්ශන හා මෙහෙයුම් අංශය 16

1.5.6 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යාන්ත පාලන අංශය 19

1.5.6.1 තොටුපල ශාඛාව 20

1.5.7 පුරවැසි අංශය 22

පිටු අංකය

1.5.8 ගිණුම් අංශය 22

1.5.9 අභ්‍යන්තර විගණන අංශය 23

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 25

2.1 2023 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය 25

2.2 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය 68

2.3 විශේෂ ජයග්‍රහණ 72

2.4 අභියෝග 73

2.5 ඉදිරි ඉලක්ක 73

03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... 75

04 පරිච්ඡේදය - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක 90

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 93

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 99

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 111

- **ඇමුණුම්**

  ඇමුණුම 01 - විගණකාධිපතිවරයාගේ වාර්තාව

*** මෙම කාර්ය සාධන වාර්තාවේ අවසානයට අමුණා ඇත.**

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේ ද, 1956 ආගාමික හා විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේ ද, පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ පනත් වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරු වන සේ ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශයන්හි දී තහවුරු කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත් කිරීම, විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ. එමෙන්ම නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම හා සුහදශීලි සේවයක් සපයා දීමට කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් කැපවී ක්‍රියා කරයි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජාතික ආදායම් උත්පාදනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන දෙපාර්තමේන්තුවකි. එසේම 2023 වසර ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත් ලබා ගැනීම සම්බන්ධයෙන් පැවති ඉල්ලුම පෙර වර්ෂයන්ට සාපේක්ෂව සීඝ්‍රයෙන් ඉහළ ගිය වර්ෂයක් ලෙස හඳුනාගත හැකි අතර, කොවිඩ් වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හමුවේ වෙනත් රාජ්‍ය ආයතන සීමා කිරීම් සහිතව සේවා සැපයුව ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල මෙන්ම ගුවන් තොටුපළ හා වරාය කාර්යාලයන් ද අඛණ්ඩව මහජන සේවාවන් සඳහා විවෘතව තබන ලදී. එසේම එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂය තුළදී රුපියල් බිලියන 42.8ක ආදායමක් ජාතික ආදායමට රැස් කර දීමට හැකියාව ලැබී තිබිණි. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 79.8%ක වැඩිවීමකි.

නෛතික අධිකාරිය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරන පුරවැසි පනත සහ ඊට අදාළ සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාළ සංශෝධන
- 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ඉහත පනත්වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු

දැක්ම

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

මෙහෙවර

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

අරමුණු

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවෙක් ලෙස කටයුතු කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපල හරහා නීත්‍යානුකූලව ඇතුළුවීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හි දී තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ටතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීම හා පිටවීම විධිමත් කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශිකයින් සඳහා වීසා බලපත් නිකුත් කිරීම හා දෙන ලද වීසා කාල සීමාව දීර්ඝ කිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන්.
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන්.

1.4 සංවිධාන ව්‍යුහය

සංවිධාන සටහන
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන්

01. පාලන අංශය

- පාලන ශාඛාව
- පුහුණු හා සංවර්ධන ශාඛාව
- ප්‍රසම්පාදන ශාඛාව
- ප්‍රවාහන ශාඛාව
- සුබසාධන ඒකකය
- මහජන තොරතුරු ඒකකය
- පිළිගැනීමේ කවුළුව
- පියස පරිශ්‍රය

02. ගමන් බලපත් අංශය

- ගමන් බලපත්‍ර ශාඛාව
- ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව
- ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- විදේශ දූත මණ්ඩල ශාඛාව
- තැපැල් ශාඛාව
- ප්‍රාදේශීය කාර්යාල

03.ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

- ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව
- ඉන්දු ලංකා පුරවැසි ශාඛාව
- නීති ශාඛාව

04. වීසා අංශය

- වීසා ශාඛාව

05. තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය

- තොටුපල ශාඛාව

06. විමර්ශන හා මෙහෙයුම් ශාඛාව

07. ගිණුම් අංශය

08. අභ්‍යන්තර විගණන අංශය

09. පුරවැසි අංශය

1.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, වාහන භාවිතය කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු හා සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු, දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල හා අනෙකුත් කාර්යයන් සඳහා වූ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මෙම අංශයේ කාර්යයන් වේ. එසේම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සහ බාහිර අංශ අතර මනා සම්බන්ධීකරණය හා කළමනාකරණය සිදු කිරීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. එම කාර්යයන් පහත සඳහන් ශාඛාවන් සහ ඒකකයන් යටතේ ක්‍රියාත්මක වේ. මෙම සියලු කටයුතු පාලක (පාලන) ගේ අධීක්ෂණය අනුව සිදුවේ.

1. පාලන ශාඛාව
2. පුහුණු හා සංවර්ධන ශාඛාව
3. ප්‍රසම්පාදන ශාඛාව
4. ප්‍රවාහන ශාඛාව
5. සුබසාධන ඒකකය
6. මහජන තොරතුරු ඒකකය
7. පිළිගැනීමේ කවුළුව
8. පියස පරිශ්‍රය

1.5.1.1 පාලන ශාඛාව

මෙම ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ. එමෙන්ම මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය , මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

1.5.1.2 පුහුණු හා සංවර්ධන ඒකකය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන සමස්ත කාර්යය වපසරිය තුළ අතීත අත්දැකීම්, නිර්මාණාත්මක භාවිතාවන්, ආචාරධර්ම පද්ධතීන් හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව හා සමාජීය, ආර්ථික දේශපාලනික, නෛතික හා තාක්ෂණික ප්‍රසාරණයන්ට සරිලන ආකාරයෙන් ගළපා ගනිමින්, ජාතික හා ජාත්‍යන්තරිකව ඇතිවිය හැකි නව්‍ය හා පුළුල් විපර්යාසයන්ට හා ඒ මඟින් ඇති විය හැකි වෘත්තීය පීඩනය හා අභියෝගයන්ට ගළපාගත හැකිවන සේ තත්කාල කාර්යය මණ්ඩලය හා කාර්යය පරාසය පුළුල් වීමට සාපේක්ෂව අලුතින් එක්වනු ලබන නව මානව සම්බන්ධතා පවත්නා හා ළඟා කරගත හැකි අවස්ථාවන් නිසි සේ කළමනාකරණය කරගනිමින්, මානව සම්පත් සංවර්ධන හා කාර්යය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම පුහුණු හා සංවර්ධන ඒකකයේ වගකීම වේ.

ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය හා දේශීය හා විදේශීය සම්බන්ධිත ආයතනවල සහයෝගය ලබාගනිමින් සඵලදායි, අභිප්‍රේරිත, කාර්යය සාධන කණ්ඩායමක් ගොඩ නැංවීම සඳහා වඩා සුදුසු කාලෝචිත, පුහුණු හා සංවර්ධන වැඩසටහන් හඳුනාගැනීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ප්‍රතිඵල ඇගයීම ද මෙම ඒකකයේ පුළුල් අරමුණු අතර වේ.

එමඟින්, පුහුණු හා සංවර්ධන ඒකකයේ 2023 වසර තුළ ඉටුකරන ලද කාර්යයභාරය පිළිබඳ තොරතුරු 6 පරිච්ඡේදයෙහි 6.3 වගුවෙන් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදනය සඳහා වගකිව යුතු ආයතනය විසින් කලින් කලට නිවේදනය කරනු ලබන අදාළ අනෙකුත් නීති රීතිවලට අනුකූලව දෙපාර්තමේන්තුව සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීමේ කාර්යය ප්‍රසම්පාදන ශාඛාව වෙත පැවරී ඇත. මෙම ශාඛාවේ පරමාර්ථය වන්නේ දෙපාර්තමේන්තුවේ අරමුණු සහ පරමාර්ථ සඳහා නිසි පරිදි, විනිවිදභාවයෙන් යුතුව භාණ්ඩ, වැඩ සහ සේවා සපයා දීමයි. ඒ අනුව, මෙම ශාඛාවේ කාර්යභාරය පහත පරිදි වේ:

- අදාළ වර්ෂය ආරම්භයේ දී සෑම වසරකම ක්‍රියාකාරී සැලැස්ම පෙළ ගස්වමින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටුවලට සහය වීම.
- මූලාශ්‍රකරණය, සාකච්ඡා, තරඟකරුවන් විශ්ලේෂණය සහ සැපයුම්කරුවන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය යන ප්‍රධාන භූමිකාවන් ඉටු කිරීම.

1.5.1.4. ප්‍රවාහන ශාඛාව

මෙම ශාඛාව මගින් ප්‍රධාන කාර්යාලයේ හා දිවයින පුරා පිහිටා ඇති වරාය ගුවන්තොටුපල, ප්‍රාදේශීය කාර්යාල සහ දේශසීමා උල්ලංඝනය කර මෙරට රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීම වැනි කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දෙනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව සතු මුළු වාහන සංඛ්‍යාව 33 කි.

1.5.1.5 සුබසාධන ඒකකය

1060 පමණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකත්වයකින් යුත් ආගමන හා විගමන සුබ සාධක සංගමය, සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළු මහත් සමාජයේ සුබ සිද්ධිය උදෙසා ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුළින් කායික හා මානසික වශයෙන් නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුළින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවයක් ලබාදීම අරමුණයි.

1.5.1.6 මහජන තොරතුරු ඒකකය

1962 දුරකතන අංකය යටතේ මහජන තොරතුරු ඒකකය දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පස්වන මහලේ ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමට අවශ්‍ය සේවාවන් පිළිබඳ සියලු තොරතුරු මෙමගින් ලබා ගත හැක.

1.5.1.7 පිළිගැනීමේ කවුළුව

දෙපාර්තමේන්තුව වෙතින් සේවා අපේක්ෂිත මහජනයා පැමිණි විගස සුහදශිලී අයුරින් පිළිගැනීම සහ නිවැරදි අංශ වෙත යොමු කිරීම සිදුකරනු ලබයි.

1.5.1.8 පියස පරිශ්‍රය

දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන මහජනතාවට අවශ්‍ය උපදෙස් ලබාදීම, අයදුම්පත් භාරදෙන අවස්ථාව දක්වා රැඳී සිටීම සහ එක් දින සේවාව යටතේ ගමන් බලපත්‍රය නිකුත් කරන තෙක් රැඳී සිටීම සඳහා පියස පරිශ්‍රය ස්ථාපිත කර

ඇත. මෙයට අමතරව මෙහිදී ගමන් බලපත්‍ර, වීසා සඳහා අවශ්‍ය ඡායාරූප ලබාගැනීමට අවස්ථාව ද, අයදුම්පත් පිරවීමට අවශ්‍ය සහයක සේවා ද සලසා ඇති අතර ආපන ශාලා,සන්නිවේදන පහසුකම් සපයා ගැනීමට හැකියාව ඇත.

1.5.2 ගමන් බලපත්‍ර අංශය

පාලක (ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මහජනතාව සමඟ වඩාත් සමීපතම අංශය වේ. ශ්‍රී ලාංකිකයින්ට විදේශ රටවලට බාධාවකින් තොරව ගමන් කිරීමට, නැවතී සිටීමට හා ආපසු ඒමට භාවිතා කළ හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලබයි. ගමන් බලපත්‍ර නිකුත් කිරීම එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යටතේ සිදු කරනු ලබන අතර මෙම සේවාවන් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කරනු ලබයි.

අරමුණු හා කාර්යභාරය

1. නිවැරදි ගුණාත්මක හා සත්‍ය තොරතුරු ඇතුළත් විදේශ ගමන් බලපත්‍ර ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
2. ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩි දියුණු කිරීමට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම.
4. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු වලට අදාළව රාජ්‍ය ආරක්ෂක අංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීම.

මෙම අංශයේ කාර්යභාරය පහත සඳහන් ශාඛාවන් 5ක් හා ප්‍රාදේශීය කාර්යාල 4ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

- ගමන් බලපත්‍ර ශාඛාව
- ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව
- ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- විදේශ දූත මණ්ඩල ශාඛාව
- තැපැල් ශාඛාව
- ප්‍රාදේශීය කාර්යාල - මහනුවර, වව්නියාව, කුරුණෑගල, මාතර

1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව

දෛනිකව වැඩිම සේවාලාභීන් සංඛ්‍යාවක් පැමිණෙන ශාඛාව ගමන් බලපත්‍ර ශාඛාවයි. ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය වශයෙන් ගමන් බලපත් ලබා ගැනීම සඳහා මහනුවර, මාතර, වව්නියාව හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 4ක් පිහිටුවා ඇත. මෙම කාර්යාලවලින් එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යන ක්‍රම දෙකටම ගමන් බලපත් නිකුත් කරනු ලබයි.

2022 වර්ෂයේ වාර්තාගත ලෙස සේවාලාභීන් වැඩිවීම නිසා ඔවුන් සඳහා උපරිම සේවයක් සැලසීමේ අපේක්ෂාවෙන් 2023.06.15 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇත.

1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝකනය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍ර වල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා ගමන් බලපත්‍රයේ 04 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, සැසඳීම හා 04 වන පිටුව පරිලෝකනය කිරීම (Compare & 04th Page Scan) සහ තත්ත්ව පරීක්ෂාව (Quality Confirm) සිදු කර ඉන් අනතුරුව අවසාන වශයෙන් අධීක්ෂණ මට්ටමේ තත්ත්ව පරීක්ෂාව (Supervisor Quality Confirm) සිදු කර එහි මුද්‍රිත වාර්තාව ද සමග එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයදුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

මීට අමතරව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයදුම්පත්‍ර අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 04 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.

මෙම ක්‍රමවේදයට අමතරව අලුතින් ආරම්භ කරන ලද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කරන ලද ගමන් බලපත් මුද්‍රණ ක්‍රියාවලියේ දී අයදුම්පත් පරීක්ෂා කිරීම, ඊට අදාළ බා(ර්)කෝඩ් (Barcode) සහිත අංක මුද්‍රණය කිරීම, ගමන් බලපත් මුද්‍රණය කිරීම ඇතුළු පසු අදියරයන් සියල්ලම සිදු කරනු ලබයි.

1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

පාලක (ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ. නිකුත් කරන ලද ගමන් බලපත්‍රයට අදාළව ගමන් බලපත්‍රලාභීන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ ගමන් බලපත්‍රයට සංශෝධනයන් ඇතුලත් කිරීම මෙම ශාඛාව මගින් සිදුකරනු ලබයි.

එක් සංශෝධනයක් සඳහා රු. 1200/- ක මුදලක් අයකරනු ලබන අතර, සරප් අංශ නිලධාරියකුගේ සහ පරිගණක අංශ නිලධාරීන් තිදෙනකුගේ ද සහාය ඇතිව පැයක කාලයක් ඇතුළත සංශෝධිත ගමන් බලපත්‍රය සේවාලාභීන් වෙත ලබාදෙනු ලැබේ.

මෙම ශාඛාවේ කාර්යභාරය පහත පරිදි වේ.

- වාසගම/වෙනත් නම් සංශෝධනය
- තනතුර සටහන් කිරීම/තනතුර ඉවත්කිරීම
- විවාහයට පෙර නම ඇතුළත් කිරීම
- විවාහයට පසු නම ඇතුළත් කිරීම
- ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම
- උපන් ස්ථානය සංශෝධනය කිරීම
- ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කිරීම
- එක් විදේශ ගමනකට වලංගු කිරීම
- තනි ගමන් සීමාව අවලංගු කිරීම
- වලංගු කාල සීමාව සඳහා පනවා ඇති කොන්දේසි ඉවත්කිරීම

1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව විදෙස් ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මඟින් අදාළ අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

1.5.2.5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් ප්‍රමාදයකින් තොරව අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් යැවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල

මාතර, මහනුවර, වවුනියාව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇති අතර, සාමාන්‍ය සේවය හා එක්දින සේවය යටතේ ගමන් බලපත් නිකුත් කිරීම හා ගමන් බලපත්‍රවල සංශෝධන කටයුතු එමගින් සිදු කරනු ලබයි.

1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

මෙම අංශය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව යන ශාඛාවන් ක්‍රියාත්මක වන අතර අධීක්ෂණය පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) / නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) මඟිනි.

1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත.

ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

1. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටුකිරීමේ දී අදාළ වන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.
2. දෙපාර්තමේන්තුවට අදාළ නීති, අණ පනත් සංශෝධනය.
3. අභ්‍යන්තර චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම හා එය ක්‍රියාවට නැගීමට අදාළ කටයුතු කිරීම.
5. පසුගිය වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
6. අනෙකුත් ආයතන වලට මාසිකව, කාර්තු වශයෙන් හා වාර්ෂිකව යැවිය යුතු ප්‍රගති වාර්තා සකස් කිරීම හා නියමිත දිනට එම වාර්තා අදාළ ආයතන වෙත යොමු කිරීම.
7. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ ප්‍රතිපත්තිමය කටයුතු වලට අදාළ රාජකාරි සම්බන්ධීකරණය කිරීම.

8. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.

9. පාර්ලිමේන්තුව විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම.

10. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා වාර්ෂිකව සිදු කරන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචනය කිරීම, සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

2023 වර්ෂයේ විශේෂ කාර්යයන්

- ප්‍රාග්ධන ව්‍යාපෘතීන් 98%ක ප්‍රගතියකින් අවසන් කිරීමට අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදුකිරීම.
- කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය ඇතුළුවීමේ සහ පිටවීමේ අනුමත තොටුපලක් ලෙස 2023.01.24 දිනැති අංක 2316/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීම.
- ඉන්දියාවේ පුනරුත්ථාපන කඳවුරුවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට විදේශ දූත මණ්ඩල හරහා සියලුම රටවල් සඳහා වන ගමන් බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) කටයුතු කරයි.

1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත,1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යන පනත්වල සඳහන් ආකාරයට සුදුසුකම් සපුරන තැනැත්තන්ට එම පනත් ක්‍රියාත්මක වූ දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි වී ඇත.

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුෂංගික කාර්යයන් ඉටු කිරීම හා මෙයට අමතරව චීන සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අදාළ 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත අනුව ඊට ආනුෂංගික කාර්යන් ඉටු කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

1.5.3.3 නීති ශාඛාව

කාර්යානුබද්ධ අණපනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමටත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණ පනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට සහාය වීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

නීති අංශයෙන් ඉටුකරන ලද කාර්යයන්:

I. අධිකරණය හා සම්බන්ධ කටයුතු දෙපාර්තෙමේන්තුව මගින් පවරා ඇති නඩුවලට අදාළ සිතාසි, වරෙන්තු කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනීම සහ එම සිතාසි, වරෙන්තු අවශ්‍ය පුද්ගලයන් වෙත යොමු කිරීමට කටයුතු කිරීම.

II. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකු වගඋත්තරකරුවෙකු ලෙස සඳහන් කරන නඩුවලට අදාළව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

III. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂි දීම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හි දී අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හි දී අධිකරණයේ පෙනී සිටීම හා සාක්ෂි ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

IV. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි සහ අධිකරණයට යොමු කරන තොරතුරු වාර්තා සකස් කර අදාළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත යොමු කිරීම.

ගිවිසුම් හා සම්බන්ධ කටයුතු

I. රාජ්‍යතාන්ත්‍රික හා රාජකාරි ගමන් බලපත් දරන්නන් සඳහා ද්විපාර්ශ්වික වීසා නිදහස් කිරීමේ ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සිදු කිරීමට කටයුතු කිරීම.

II. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ වන්නාවූ කාර්යයන්ට සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තමේන්තුව එළඹ ඇති ගිවිසුම් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

III. මෙම දෙපාර්තෙමේන්තුවේ විෂය පථයට අදාළව විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්, ආරක්ෂක අමාත්‍යාංශයෙන් හා වෙනත් අමාත්‍යාංශවලින් යොමු කරන ලද ශ්‍රී ලංකාව සමඟ විදේශ රටවල් අත්සන් කිරීමට නියමිත විදේශීය ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දීම හා මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයෙන් යොමු කරන ලද ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ යොමු කිරීම

IV. නැවත ප්‍රවේශ කර ගැනීමේ ගිවිසුම් (re-admission) සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම හා විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

V. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස සම්බන්ධව අදාළ පාර්ශ්ව අතර ඇති කරගන්නා බදු ගිවිසුම් සැකසීමට අදාළ නීති උපදෙස් ලබා දීම හා ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

VI. සේවා සපයන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සමඟ ඇතිකර ගනු ලබන ගිවිසුම්වලට අදාළව නිෂ්කාශන ලබා දීම.

VII. මෙම දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය ආයතන සමඟ එළැඹෙන ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාදීම, නීතිපති දෙපාර්තමේන්තු නිර්දේශ ලබා ගැනීම සහ අත්සන් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

වෙනත් පැමිණිලි

I. පොලිස් ස්ථානාධිපතිවරුන්,වෙනත් ආයතන සහ පුද්ගලයන් විසින්, ආගාමික හා විගාමික පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම්වලට අදාළව සිදුවන වංචා සහ වෙනත් පැමිණිලිවලට අදාළව මෙම අංශයට යොමු කරන ලද ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

1.5.4 වීසා අංශය

පාලක (වීසා) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. විදේශීය ජාතිකයින්ගේ ගමන් බලපත්‍රවල වීසා කටයුතුවලට අදාළ ක්‍රියාවන් මෙම අංශයෙන් සිදු වේ.

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ III කොටසෙහි, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීමට අදාළ විධිවිධාන අනුව පනතට අදාළ ව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසීන් හි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූල ව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා කාලය දීර්ඝ කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

රට තුළට පැමිණෙන විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා දිර්ඝ කිරීම තුළින් රටේ ජාතික ආදායමට සුවිශේෂී දායකත්වයක් ලබා දීම, අත්‍යවශ්‍ය සේවයන් සඳහා සේවයේ නියුතු විදේශිකයන්ට පහසුකම් සැලසීම මගින් ජාතික සංවර්ධනයට දායක වීම, රටට හිතකර ආකාරයට වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

ඉහත ආගාමික හා විගාමික පනත සහ එහි රෙගුලාසිවලට අනුකූලව මෙරටට පැමිණෙන විදේශිකයන් සඳහා නේවාසික/ වාස වීසා හා නේවාසික නොවන වීසා යනුවෙන් ප්‍රධාන වීසා කාණ්ඩ දෙකක් යටතේ මෙම දෙපාර්තමේන්තුව මගින් වීසා නිකුත් කෙරේ.

නේවාසික / වාස වීසා (Resident Visa)

විශේෂිත අරමුණු සඳහා ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීන ව වාසය කිරීමට අපේක්ෂා කරන පහත සඳහන් කාණ්ඩවලට අයත් ශ්‍රී ලාංකිකයන් නොවන පුද්ගලයින් හට මෙම වීසාවන් නිකුත් කෙරේ.

01. සේවා නියුක්තිකයන්
- ආයෝජන මණ්ඩලය යටතේ ව්‍යාපෘතිවල සේවයේ නියුතු වූවන්
- රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන්
- විදේශ දූත මණ්ඩල යටතේ ඇති ආයතනවල සේවයේ නියුක්ත වූවන්
- පෞද්ගලික සමාගම් /රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල සේවකයන්

02. ආයෝජනය කරන්නන්
- ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කරන්නන්
- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල නියුක්තවූවන්

03. ආගමික කාර්යයන් සඳහා පැමිණෙන්නන්
- පූජ්‍ය පක්ෂය
- ආගමික ස්ථාන ඉදිකරන්නන්/ ආවතේවකරුවන්

04. ශිෂ්‍යයන්
  - විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්
  - රජයේ අනුමත අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්

05. 1967 ඉන්දු ලංකා ගිවිසුමෙන් ආවරණය වන ලියාපදිංචි ඉන්දියානුවන්

06. හිටපු ශ්‍රී ලාංකිකයන් හා ඔවුන්ගේ යැපෙන්නන්

07. ශ්‍රී ලාංකිකයකුගේ පවුලේ සාමාජිකයින්
  - විදේශීය කලත්‍රයා
  - විදේශිකත්වය හිමි ළමයින්

08. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවල සේවයේ යෙදී සිටින්නන් හා යැපෙන්නන්

09. මගේ සිහින නිවහන (My Dream Home)

10. ආගන්තුක (RGS) වීසා

11. වෛද්‍ය හේතූන් මත රැඳී සිටින්නන් හට ලබා දෙන වීසා

12. රන් පාරාදීසය වීසා වැඩසටහන (Golden Paradise Visa Program)

13. කොළඹ වරාය නගරය (Colombo Port City)

14. අධිකරණයේ (Court) පෙනී සිටීම සඳහා ලබාදෙන වීසා

නේවාසික නොවන වීසා (Non -Resident Visa)

කෙටි කාලීන අවශ්‍යතාවයන් සඳහා මෙරටට පැමිණීම සඳහා නිකුත් කරනු ලබන වීසා වර්ගයයි. එය පැමිණීමේ හා මාර්ගස්ථ වශයෙන් වන අතර පැමිණීමේ වීසා, සංචාරක හා ව්‍යාපාරික වශයෙන් දෙයාකාර වේ.

පැමිණීමේ වීසා (Visit Visa)

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් හා විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) යටතේ සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටි කාලීනව විදේශිකයන් වෙත මෙම වීසා නිකුත් කරනු ලැබේ.

I. සංචාරක වීසා

පහත කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට කෙටි කාලීන ව පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ දින 30 ක කාලයක් සඳහා මෙම වීසා නිකුත් කෙරේ.

- MICE – සංචාරක කටයුතු - ආයෝජක සම්මන්ත්‍රණ/ ප්‍රදර්ශන/ වැඩසටහන්/ ජම්බෝරිය (TOURISM -Investors Conference/ Exhibitions/ Events/ Jamboree)
- ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම - හර්බල් (Medical Treatment Including Ayurvedic Herbal)
- කලා, සංගීත හා නර්තන වැඩසටහන් සඳහා සහභාගිවීම (Participant in Art Music and Dance Event)
- වන්දනා/ ක්‍රීඩා වැඩසටහන්/ විවාහ මංගල උත්සවවලට සහභාගිවීම (Participant in Pilgrimages/ Sport Event/ Weddings)
- සංචාර හෝ නිවාඩුගත කිරීම සඳහා (Sightseeing or Holidaying)
- හිතමිතුරන් හා ඥාතීන් බැලීම සඳහා (Visiting Friends and Relatives)

2. කෙටි කාලීන ව්‍යාපාරික කටයුතු සඳහා වන වීසා (Business Visa)

සංචාරක නොවන කෙටි කාලීන ව්‍යාපාරික ස්වරූපයේ අනෙකුත් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙම වීසා නිකුත් කරනු ලැබේ. මේ සඳහා අදාළ කාර්යය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතුය. (උදා: ව්‍යාපාරික සාකච්ඡා/ ආයතනික වැඩමුළු) ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණෙන්නන් හට වසරක වීසා කාලයක් ලබා දේ.

3. බහුවාර පිවිසුම් වීසා - ව්‍යාපාරික (Multiple Entry Visa - Business)

මෙම වීසා ද ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට වසරක කාලයක් සඳහා ලබා දෙන අතර, මෙම වීසා ලබා ගැනීමෙන් පසු මෙරට රැඳී සිටිය හැකි කාලය උපරිම දින 180 කි.

මාර්ගස්ථ වීසා (Transit Visa)

ශ්‍රී ලංකාවෙන් බැහැර ව වෙනත් රටක සිට තවත් රටක ගමනාන්තයක් කරා යන අතරතුර දී ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා නිකුත් කරනු ලබන වීසාවකි. මෙය දින 2 ක උපරිමයකට යටත් ව නොමිලයේ නිකුත් කරනු ලැබේ.

වීසා ක්‍රමවේදය සරල කිරීම

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/1593/626/016 හා 2023.08.29 මගින් "ආගමන හා විගමන දෙපාර්තමේන්තුව දැනට ක්‍රියාත්මක වන වීසා ක්‍රමවේදය සරල කිරීම" සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව රෙගුලාසි සකස් කර එම රෙගුලාසි පාර්ලිමේන්තුවේ සම්මත කර අංක 2360/24 හා 2023.11.27 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් පළකරන ලදි.

එම සංශෝධනය අනුව සිදු වී ඇති වෙනස්කම් පහත පරිදි වේ.

(අ) වාස වීසා

- වර්ෂයකට ඇමරිකානු ඩොලර් 200ක ගාස්තුවකට යටත්ව "ආයෝජක වීසා" ලබාදීම (ඇ.ඩො. 100,000ක් ආයෝජනය කරන්නන් සඳහා වසර 05ක් ද, ඇ.ඩො. 200,000ක් ආයෝජනය කරන්නන් සඳහා වසර 10ක් ද වශයෙනි.)
- ඇමරිකානු ඩොලර් 200ක ගාස්තුවකට යටත්ව "සේවා නියුක්ති වීසා" වර්ෂයකට නිකුත් කිරීම
- ඇමරිකානු ඩොලර් 200ක ගාස්තුවකට යටත්ව "පූජ්‍ය පක්ෂය හා ආගමික කාර්යයන්වල යෙදෙන්නන් " සඳහා වර්ෂයකට වීසා නිකුත් කිරීම
- ඇමරිකානු ඩොලර් 200ක ගාස්තුවකට යටත්ව "ශිෂ්‍ය වීසා" විදේශීය ශිෂ්‍යයින්ට සම්පූර්ණ අධ්‍යයන කාලයටම නිකුත් කිරීම
- රාජ්‍ය නොවන සංවිධාන/ අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන/ අන්තර් ජාතික සංවිධානවල සේවය කරන්නන්ට ඇමරිකානු ඩොලර් 200ක ගාස්තුවකට හා විදේශ කටයුතු අමාත්‍යාංශය නිර්දේශ කරන ලද සංවිධාන 31කට වීසා ගාස්තු අයකිරීමකින් තොරව ද වීසා ලබාදේ.
- වෘත්තීය වශයෙන් ඩිජිටල් තාක්ෂණය භාවිත කරනු ලබන සංචාරකයන්ට වර්ෂයක් සඳහා ඇමරිකානු ඩොලර් 500ක ගාස්තුවක් අය කර "ඩිජිටල් නොමැඩ්" වීසාවක් නිකුත් කිරීම.
- කොළඹ වරාය නගරය සඳහා PCC නේවාසික, PCC ව්‍යාපාරික හා PCC සේවා නියුක්ති ලෙස වීසා කාණ්ඩ තුනක් හඳුන්වා දීම.
- මගේ සිහින නිවහන වීසා හා නේවාසික ආගන්තුක වීසා යනුවෙන් සඳහන් වීසා කාණ්ඩ දෙක ඉදිරියේ දී ක්‍රියාත්මක නොවන අතර. දැනට එම වීසා ලබා ගෙන ඇති අයට වීසා දීර්ඝ කිරීම පමණක් සිදු කිරීම.

- ශ්‍රී ලාංකික පුරවැසියකුගෙන් යැපෙන විදේශීය දෙමව්පියන් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකුගේ නීතිමය හිමිකම් ඇති භාරකරුවකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වී සිටින විදේශීය කලත්‍රයාගෙන් යැපෙන වැඩිහිටි දෙමව්පියන් හෝ සඳහා නව වාස වීසාවක් හඳුන්වා දීම.

(ආ) සංචාරක වීසා

- "සම්මත පැමිණීමේ වීසා" යනුවෙන් අලුතින් හඳුන්වා දී ඇත. එය සංචාරක හෝ ව්‍යාපාරික වශයෙන් කෙටි කාලීනව පැමිණෙන විදේශිකයන් හට එකවර මාස 06ක කාලයකට ලබාදෙන අතර එක් වරක දී උපරිම වශයෙන් රට තුළ මාස 02ක් රැඳී සිටීමට යටත්ව ද්විත්ව පහසුකම් සහිත වීසාවකි. එසේම මෙම වීසාව ගුවන් තොටුපලට පැමිණි පසුව ද ලබා ගත හැක.
- තවද, පැමිණීමේ වීසා සංචාරක හෝ ව්‍යාපාරික යන දෙවර්ගය සඳහා එකවර වසරක කාලයකට, එක් වරක දී උපරිම වශයෙන් රට තුළ දින 90ක් රැඳී සිටීමට යටත්ව බහුවාර පැමිණීම් පහසුකම් සහිත නව වීසාවක් ද ඇත.
- ඉහත පරිදි ම පැමිණීමේ සංචාරක හෝ ව්‍යාපාරික වීසා, එක් වරකදී මෙරට තුළ රැඳී සිටිය හැකි කාලය දින 180කට යටත්ව බහුවාර පැමිණීම් පහසුකම් සහිතව වසර 2ක්, වසර 5ක් හා වසර 10ක් ලෙස ලබා දීමට (Multiple Entry Visitor Visa) පහසුකම් සලසා ඇත.

(ඇ) මාර්ගස්ථ වීසා

- ශ්‍රී ලංකාව හරහා වෙනත් ගමනාන්තයක් කරා යන මගියෙකුට දින දෙකක් ගාස්තු ගෙවීමකින් තොරව මාර්ගස්ථ වීසාවක් ලබා දේ.
- ශ්‍රී ලංකාවේ වරායක් හරහා මගී යාත්‍රාවකින් යන සංචාරකයින්ට මෙරට තුළ දින 04ක් සංචාරය කිරීමට මාර්ගස්ථ වීසාවක් ලබා දීමට ඇමරිකානු ඩොලර් 25ක ගාස්තුවක් අය කෙරේ.
- ශ්‍රී ලංකාවේ ජල තීරයෙහි ඇති නැවක වෙළඳ නාවික පිරිසේ සාමාජිකයන් දින 30ක කාලයක් ගොඩබිමට පැමිණීම සඳහා ගාස්තු අය කිරීමකින් තොරව වෙරළ අවසර පත්‍රයක් ලබා දේ. ඔවුන් තවදුරටත් රැඳී සිටින්නේ නම් ඉදිරි මාස 02ක් සඳහා මාසික ගාස්තුව ඇමරිකානු ඩොලර් 25ක් ගෙවීමෙන් වීසා දීර්ඝ කර ගත හැක. පැමිණි දින සිට මාස 03කට වඩා වැඩි කාලයක් රැඳී සිටින්නේ නම් අදාළ ගාස්තු ගෙවා වීසා අයදුම් කළ යුතුය.

ඉහත සඳහන් වීසා ලබාදීම් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සලකා බලා ගනු ලබන තීරණයන්ට අනුව වීසා නිකුත් කිරීමේ දැනට පවතින ක්‍රමවේදයම අනුගමනය කිරීම සහ ඒ අනුව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගැනීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ආරක්ෂණ සැලැස්ම ලබා ගැනීම තවදුරටත් ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ.

(ඇ) ස්ථිර වාස වීසා

- ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීමට හැකියාවක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසිභාවය හිමිව තිබූ පුද්ගලයන් සඳහා ද, ශ්‍රී ලාංකික පුරවැසියකුගේ විදේශීය කලත්‍රයාට හා විදේශීය දරුවන්ට ස්ථිර වාස වීසාවක් නිකුත් කිරීම සඳහා රෙගුලාසි සකස් කර අවසාන කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇත.

1.5.5. විමර්ශන හා මෙහෙයුම් ශාඛාව

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 රෙගුලාසි සහ ජාත්‍යන්තර සම්මුතීන් වලට අනුකූල නොවන හා රටෙහි ආරක්ෂාවට තර්ජනයක් වන විදේශිකයන්, ශ්‍රී ලංකාවට ඇතුළුවීමට පෙර, ඇතුළුවන විට හා එහි රැදී සිටින විට, හඳුනා ගැනීම, ලංකාව තුළ දී ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝනය කරමින් රැදී සිටින අයවලුන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම, ඉහත වැරැදි වැළැක්වීමට සක්‍රීය ප්‍රවේශයකින් කටයුතු කිරීම, ඒ හා සම්බන්ධ නීතිය බලාත්මක කිරීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

මෙම ශාඛාව අංශ 5ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

1. විමර්ශන ඒකකය (Investigation Unit)
2. රඳවා තැබීමේ මධ්‍යස්ථාන (Detention Centers)
3, තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (National Anti Human Trafficking Resource Center)
4. අවදානම් තක්සේරු කිරීමේ මධ්‍යස්ථානය (Risk Assessment Center)
5. දේශසීමා ආවේක්ෂණ ඒකකය (Border Surveillance Unit)

1. විමර්ශන ඒකකය (Investigation Unit)

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැදී සිටින විදේශිකයින් අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, රටින් ඉවත් කිරීම හා ඒ සම්බන්ධ විමර්ශන කාර්යයට අදාළ වෙනත් කටයුතු මෙම ඒකකය මඟින් සිදුකරයි. එම විමර්ශනයන්, ආකාර දෙකකට සිදුකරනු ලැබේ.

I. ක්ෂේත්‍ර අවේක්ෂණය
II. දුරස්ථ ආවේක්ෂණය

I. ක්ෂේත්‍ර අවේක්ෂණය

ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ තොරතුරු හා පැමිණිලි මත අදාළ ස්ථානවලට ගොස් ස්ථානීය පරීක්ෂණයන් සිදු කරන අතර, විදේශිකයන්ගේ ගමන් බලපත්‍ර පරීක්ෂා කොට අවශ්‍ය ඉදිරි පියවරයන් ගැනීම සඳහා කටයුතු කරයි. 2023 වසරේ රට තුළ පැවති ඉන්ධන අර්බුදය හා පැවති වාතාවරණය හේතුවෙන් ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ විමර්ශන කටයුතු සිදු කිරීම් සීමා කිරීමට සිදු විය. මෙම වසරේ දී ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ සිදු කළ සමස්ත විමර්ශනයන් සංඛ්‍යාව 785ක් විය.

II. දුරස්ථ ආවේක්ෂණය

ක්ෂේත්‍ර ආවේක්ෂණ හා විමර්ශන කටයුතුවලට අමතරව, දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය ඇසුරින් දුරස්ථ ආවේක්ෂණය හරහා ශ්‍රී ලංකාව තුළ රැදී සිටින හා ලංකාවට පැමිණෙන විදේශිකයින්ගේ නිවැරදි තොරතුරු රැස්කිරීම, තොරතුරුවල නිවැරදි බව තහවුරු කිරීම සඳහා විමර්ශන අංශය මඟින් 2019 වර්ෂයේ සිට දුරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය හරහා සැක සහිත විදේශිකයන්ගේ තොරතුරු විපරම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

වීසා දීර්ඝ නොකිරීම නිසා මිනිස් ජාවාරමට හසු වීමට හෝ තැනැත්තන් වෙළඳාමේ වින්දිතයන් වීමට විභවයක් ඇති, විශේෂයෙන් විදේශික කාන්තාවන් එයින් මුදා ගැනීමට හා එමඟින් ආගමන හා විගමන නීති හා වෙනත් නීති උල්ලංඝනය වීමට තිබූ හැකියාව තුරන් කිරීමට දුරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලිය හරහා හැකි වී ඇත.

2. රඳවා තැබීමේ මධ්‍යස්ථාන (Detention Centers)

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටි විදේශිකයන් සහ ශ්‍රී ලංකාව තුළ විවිධ අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව, නීතිමය කටයුතු අවසන් වූ පසු මෙරටින් ඉවත් කිරීමට නියමිත විදේශිකයන් රඳවා තබා ගැනීම, ඉවත් කරන තෙක් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම සහ අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම මෙම රැඳවුම් මධ්‍යස්ථාන මගින් සිදු කරයි.

ඒ අනුව, රැඳවියන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍යතා මතු වූ විට රාජකාරියේ නිරත නිලධාරීන් විසින් එම රැඳවියන් රෝහල් කරා රැගෙන යාම, රෝහල්ගත කිරීමට අවශ්‍ය අවස්ථාවල දී රෝහල්ගත කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී වෛද්‍ය කඳවුරු පැවැත්වීම ද සිදු කරනු ලබයි.

දැනට මෙම දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන රැඳවුම් මධ්‍යස්ථාන දෙකකි.

I. මිරිහාන රඳවා තැබීමේ මධ්‍යස්ථානය
II. වැලිසර රඳවා තැබීමේ මධ්‍යස්ථානය

මෙම රඳවා තැබීමේ මධ්‍යස්ථානවල රඳවා තබන විදේශිකයන් වන්නේ;

1. විමර්ශන අංශය මගින් ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
2. අධිකරණ නියෝග මත රටින් පිටුවහල් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට භාර දෙන විදේශිකයන්
3. ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය මගින් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
4. ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් දෙපාර්තමේන්තුව වෙත භාර වන විදේශිකයන්

3. තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NAHTRC)

තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය යටතේ ක්‍රියාත්මක වන ඒකකයක් වන අතර, ඒ මඟින්, රට තුළ සිටින විදේශිකයන්ට සහ දේශසීමා හරහා සිදුවන තැනැත්තන් වෙළඳාම, තැනැත්තන් ජාවාරම සහ අනෙකුත් අවිධිමත් සංක්‍රමණ සිදුවීම් හඳුනා ගෙන ඒවා වැළැක්වීම සඳහා විමර්ශන අංශයට සහය ලබා දීම, ආගමන හා විගමන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ඉහත සිදුවීම් විමර්ශනයට සම්බන්ධ වන අනෙකුත් ආයතන වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය සහ ජාතික වශයෙන් පිහිටුවා, ආරක්ෂක අමාත්‍යාංශය මගින් මෙහෙයවන, තැනැත්තන් වෙළඳාම වැළැක්වීමේ කාර්ය සාධන බලකාය වෙත කරුණු යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය සහ-සම්බන්ධීකරණය පවත්වාගෙන යාම, ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් සකසන "තැනැත්තන් වෙළඳාම පිළිබඳ වාර්තාව" සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වාර්ෂිකව සිදු කළ වැඩසටහන්වල තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය හරහා දැනුවත් කිරීම, ගුවන් තොටුපලෙහි ආගමන හා විගමන අංශය සහ විශේෂයෙන් දේශ සීමා ආවේක්ෂණ ඒකකය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, විදේශ ආගමන හා විගමන නිලධාරීන් සමග බුද්ධි තොරතුරු හුවමාරුව, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමග තැනැත්තන් වෙළඳාම සහ ජාවාරම වැළැක්වීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදුකෙරේ.

4. අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (Risk Assessment Center)

- 2019 මැයි මස විමර්ශන අංශය යටතේ පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය මඟින් ප්‍රත්‍යන්ත පාලන කටයුතුවලට අදාළ හා ඊට අනුෂංගික බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම, සකස් කිරීම, සැලසුම් කිරීම හා විශ්ලේෂණය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ඇතුළුවීමට බලාපොරොත්තුවන, රටට ඇතුළුවන, රට තුළ රැඳී සිටින හා ශ්‍රී ලංකාවෙන් පිටවන අවදානම් සහගත මඟීන් හා ප්‍රවණතා කල්තියා හඳුනා ගැනීම සිදු කරනු ලබයි. එමඟින් ඔවුන් රටට පැමිණීම හෝ පිටවීම වළක්වාලීම සහ එකී තොරතුරු ආරක්ෂාවට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ හුවමාරු කරගැනීම අවදානම් තක්සේරු මධ්‍යස්ථානයේ කාර්යයන් වේ. ඒ අනුව, කෙටිකාලීන හා දීර්ඝ කාලීන ආගමන විගමන ආරක්ෂක හා විමර්ශන ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දත්ත ඉතා ඵලදායීව යොදා ගනු ලැබේ.

- මෙම ඒකකය හරහා තැනැත්තන් වෙළඳාම්කරුවන්, වින්දිතයන්, තැනැත්තන් ජාවාරම්කරුවන්, නීති විරෝධී සංක්‍රමණිකයන්, සංවිධානාත්මක අපරාධකරුවන් විසින් නීති විරෝධී ක්‍රියාවන් සඳහා යොදා ගන්නා ගමන් මාර්ග හඳුනා ගැනීම සිදු කරනු ලබයි. එමෙන්ම, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් සහගත නව සංක්‍රමණ ප්‍රවණතා (Patterns) සම්බන්ධව නිරන්තර අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

- මඟියෙකු රටට ඇතුළු වීමට පෙර වීසා සම්බන්ධව විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ දී අවදානම් සහගත විදේශිකයන්ගේ වීසා අනුමත කිරීමට ප්‍රථමයෙන් ඔවුන් පිළිබඳ සොයා බැලීම මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි.

- වීසා කාලය ඉක්මවා මෙරට රැඳී සිටින විදේශිකයන්ගේ තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම හා අවශ්‍ය පරිදි අනෙකුත් දෙපාර්තමේන්තුවල සහය ලබා ගැනීම සහ විවිධ වීසා කාණ්ඩයන් යටතේ මෙරටට පැමිණෙන තැනැත්තන් හා ඔවුන් නැවතී සිටින ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම, හුවමාරු කර ගැනීම හා තොරතුරු යාවත්කාලීන කිරීම ද මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි.

5. දේශ සීමා ආවේක්ෂණ ඒකකය (Border Surveillance Unit)

සංවිධානාත්මක අපරාධ ලෙස සැලකෙන මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම අවම කිරීම සහ වීසා අවභාවිතාවන් පිළිබඳ විමර්ශනයන්ට අවශ්‍ය සහය ලබා දීමේ අරමුණු ඇතිව 2019 ජූලි මස සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කේන්ද්‍ර කරගනිමින් දේශසීමා ආවේක්ෂණ ඒකකය ස්ථාපිත කර ඇත.

දේශසීමා ආවේක්ෂණ ඒකකයෙන් ඉටු කරන කාර්යයන්;

- මෙම ඒකකය හරහා තැනැත්තන් වෙළඳාම්කරුවන් හා වින්දිතයන්, තැනැත්තන් ජාවාරම්කරුවන් හා සංචාරක වීසා අවභාවිතා කරන්නන්, ව්‍යාජ ගමන් බලපත්‍ර හා ව්‍යාජ ලියකියවිලි භාවිත කරන්නන් හඳුනා ගැනීම සිදු කරනු ලබයි. ඒ හරහා සොයාගනු ලබන බුද්ධි තොරතුරු, විමර්ශන ඒකකය හා මිනිස් ජාවාරම් තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය වෙත සන්නිවේදනය කිරීම තුළින් තැනැත්තන් වෙළඳාම හෝ මිනිස් ජාවාරම් සහ වෙනත් සංවිධානාත්මක අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු මෙහෙයවනු ලබයි. එමෙන්ම, විමර්ශන ඒකකය හා අවදානම් තක්සේරු මධ්‍යස්ථානය විසින් සොයාගනු ලබන බුද්ධි තොරතුරු මෙම ඒකකයට සන්නිවේදනය කිරීම තුළින් අදාළ සැක කටයුතු ආගමන හා විගමන පිළිබඳ ගුවන් තොටුපලේ දී දැඩි සුපරීක්ෂාවට ලක් කෙරේ.

- 2023 වර්ෂය සඳහා, මෙම ඒකකය මඟින් ව්‍යාජ ලියකියවිලි 181ක් හඳුනා ගෙන ඇති අතර, අක්‍රමවත් සංක්‍රමණ 415 හඳුනා ගනිමින් එවැනි ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පහසුකම් සපයන්නන්, අපරාධවලට සම්බන්ධ සේවාදායකයින්, වින්දිතයන් සහ ශ්‍රී ලංකාව කේන්ද්‍ර කරගත් මිනිස් ජාවාරම් සිදුවීම් බොහෝමයක් ව්‍යර්ථ කිරීමට හැකි වී ඇත.

  මෙම ඒකකයට අදාළව පිහිටුවා ඇති ලියකියවිලි පරීක්ෂණාගාරය (Document Lab) මඟින් නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් ලියකියවිලිවල නිරවද්‍යතාව තහවුරු කරගන්නා අතර එම තත්ත්වයන් මෙම දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන්ම ගුවන් සේවා සමාගම් හා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ද ලබාදෙනු ලැබේ.

1.5.6 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (තොරතුරු තාක්‍ෂණ) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

මූලික කාර්යභාරය

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඪාංග බාධාවකින් තොරව පවත්වා ගෙනයාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව සැලසෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම වේ.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යක් වේ.

තවද රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකරණ, ආරක්ෂක අංශ (පොලිසිය හා ත්‍රිවිධ හමුදා), ව්‍යවස්ථාපිත මණ්ඩල,කොමිෂන් සභා, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු විවිධ ආයතන වලින් ඉල්ලා සිටිනු ලබන, විවිධ පුද්ගලයන්ගේ විදේශ ගමන් සම්බන්ධ වාර්තා මෙම දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ පවතින තොරතුරු අනුව අදාළ ආයතන වෙත නිකුත් කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ඉහතින් දැක්වූ මූලික කාර්යය භාරයන්ට අමතරව පහත දැක්වෙන කාර්යයන් ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලබයි.

01. මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදී වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහළ නැංවීම.
02. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
03. පවතින දෘඪාංග හා මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරිම(Upgrade).
04. උසාවි නියෝග මත මගී ගුවන් ගමන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරීම.
05. පාලක (ගමන් බලපත්) ගේ නියෝග පරිදි ගමන් බලපත් අසාදු ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබාදීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ

මෙම අංශය සමග වන අතර, අවශ්‍ය විටක දී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 555 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

අස්ථානගත වූ හා සොරකම් කරන ලද ගමන් බලපත්‍ර ඒකකය (SLTD)

අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබාදෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් සෘජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ.ඒවා විමර්ශනය කර එම ගමන් බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැළැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධි කටයුතු සිදුවීම වැළැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශීය දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 4234ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 4184 ක් ජාත්‍යන්තර පොලිසියේ දත්ත පද්ධතියට යවා ඇත. ඉතිරි ගමන් බලපත්‍ර නැවත අයදුම්කරුවන් වෙත ලැබුණු බවට වාර්තා වී ඇත.

ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබාදීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටක දී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 555 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

නැවත භාරගැනීමේ ගැටලු කළමනාකරණ පද්ධතිය. (RCMS)

විදේශයක දී පිටුවහල් කරන ශ්‍රී ලාංකිකයින් සඳහා ඒ ඒ රටවල පිහිටුවා ඇති තානාපති කාර්යාල මගින් ඔවුන්ගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කර, ඉන්පසු පරිගණක පද්ධතිය මගින් අප දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබයි. එම පරිගණක පද්ධතිය තුලින්ම දෙපාර්තමේන්තුව සතු ගමන් බලපත් දත්ත සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කර ගෙන අවසාන වශයෙන්, පුද්ගලයාගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කිරීම කරනු ලබයි. ඉන්පසු තාවකාලික ගමන් ලියවිල්ලක් නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දේ.

1.5.6.1 තොටුපල ශාඛාව

ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරමින්, එකී විදේශ ගමන් බලපත්‍ර දරන්නන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම, ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන් ඇතුළු සමස්ත ආගාමිකයන්ගේ හා විගාමිකයන්ගේ නිෂ්කාශන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව, ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදෙමින්, ජාතික ආර්ථිකයට ධනාත්මක උත්තේජනයක් ඇතිවන පරිදි, දිවයින වටා පිහිටි සියලුම සක්‍රීය, අනුමත මුහුදු හා ගුවන් තොටුපලවල දී ප්‍රත්‍යාන්ත පාලනය ඉටුකිරීම. ඒ සඳහා අවශ්‍ය භෞතික හා මානව ආධාරක සේවා සැපයීම, සමස්ත සේවාලාභීන් සම්බන්ධීකරණය කිරීම. මීට අමතරව ශ්‍රී ලංකාව තුළ විදේශ දූත මණ්ඩල හා වීසා අංශ ස්ථාපනය කර නොමැති විදේශ රටවලට ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර දූතායනය (කුරියර්) කිරීමට අවශ්‍ය නෛතිකමය අධිකාරය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙනුවෙන් ලබාදීම. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ නීතිය බලාත්මක කිරීමේ ආයතනවලට අවශ්‍ය වන ප්‍රත්‍යාන්ත පාලන තොරතුරු අවශ්‍යතාවය මත ලබාදීම.

ශ්‍රී ලංකාව තුළ වීසා අංශ ස්ථාපිත කර නොමැති රටවල් සඳහා පිටත්ව යාමට බලාපොරොත්තු වන ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන්ට ශ්‍රී ලංකාවේ සිට රටෙහි තානාපති කාර්යාලයට අදාළ ගමන් බලපත්‍ර දූතායනය (කූරියර්) කිරීමට අදාළ නෛතික අවසරය ලබාදීම.

- ශ්‍රී ලංකාවට ගොඩ බසින විදේශ නාවික කාර්ය මණ්ඩල හා සම්බන්ධ වන බැඳුම්කරවලට අදාළ නාවික නියෝජිතයන් හා එළඹීම.
- සියලුම අනුමත සක්‍රීය තොටුපලයන්හි භෞතික හා මානව සංවර්ධන කටයුතු සමාලෝචනය හා අවශ්‍ය අංශ සමග සම්බන්ධිකරණය.
- තොටුපළයන්හි ඉදිරි සංවර්ධන කටයුතු පුරෝකථනය.
- තොටුපළ අංශයට සම්බන්ධිත කරුණු වලදී අදාළ නියෝජනයන් ලබාදීම.
- මගී නෞකා මගින් ශ්‍රී ලංකාවේ සංචාරයන් සඳහා පැමිණීමට බලාපොරොත්තුවන මගීන්ට අවශ්‍ය නිෂ්කාශන කටයුතු දියමත දී ලබාදීම සඳහා නිලධාරීන් හා අවශේෂ කාර්ය මණ්ඩල පිටත්කර යැවීම හා සියලු සම්බන්ධීකරණ කටයුතු.
- සිවිල් ගුවන් සේවා අධිකාරිය, ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම අදාළ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නැව් නියෝජිතායතනය (CASA), ගුවන් සේවා සමාගම් නියෝජිතයන්, අදාළ නියෝජිතායතන (AOC) වැනි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශ ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- තොටුපළ කටයුතු හා සම්බන්ධිත වෘත්තීය සමිති හා සම්බන්ධීකරණ කටයුතු.

කාර්යයන්

1. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටවන මගීන්ගේ නිෂ්කාශණ කටයුතු ඉටුකිරීම.
2. විදෙස් රටවල තානාපති කාර්යාල ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර නොමැති රටවල් සඳහා ඇතුළුවීමට අවශ්‍ය වීසා ලබා ගැනීමට අවශ්‍ය වන පුද්ගලයන්ගේ ගමන් බලපත් අදාළ තානාපති කාර්යාල ඇති රටවල් වෙත තැපැල් මගින් යැවීම (කූරියර් කිරීම) සඳහා අනුමැතිය ලබාදීම.
3. ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
4. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නාවික කාර්යමණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම.
5. විදේශගත වූ මගීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුළත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම.
6. ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (Electronic Travel Authorization) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපළවල දී විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම.
7. උසාවි මගින් නිකුත් කර ඇති රටින් පිටවීම හා මෙරටට පැමිණීම තහනම් නියෝග ක්‍රියාත්මක කිරීම හා වෙනත් ආයතන මගින් පුද්ගලයන් රටින් පිටවීම හා රටට පැමිණීම පිළිබඳව විමසා එවන ලිපි සම්බන්ධ රාජකාරි.
8. ශ්‍රී ලංකාවෙන් පිටවීමේ දී හා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී තොටුපලවල දී මගීන් විසින් සම්පූර්ණ කළයුතු ආගමන / විගමන පත්‍රිකා නිකුත් කිරීම.
9. තොටුපළ වලට අනුයුක්ත ආගමන හා විගමන නිලධාරීන්ගේ සේවාවන් මෙහෙයවීම, අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

අනුමත ඇතුල්වීමේ හා පිටත්වීමේ තොටුපළ

1. කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
2. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - මත්තල
3. කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ - රත්මලාන
4. කොග්ගල ගුවන්තොටුපළ
5. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය (හම්බන්තොට ජාත්‍යන්තර වරාය Hambantota International Port)
9. ත්‍රිකුණාමලය වරාය
10. තලේමන්නාරම් ජැටිය
11. නොරොච්චෝලෙයි වරාය
12. ඔලුවිල් වරාය
13. මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ
14. කන්කසන්තුරෙයි වරාය
15. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය (Colombo Port City Special Port Economic Zone)

1.5.7 පුරවැසි අංශය

මෙම පුරවැසි අංශයේ කටයුතු ක්‍රියාත්මක වනු ලබන්නේ 1948 අංක 18 දරන පුරවැසි පනතින් ලද ව්‍යවස්ථාපිත බලය යටතේය. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිලබලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ලේකම්වරයාට වන අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියා පටිපාටි, ආගාමික හා විගාමික පනතින් පාලනය වන, විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ සෘජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්මේන්තුවෙහි ස්ථාපිත කර ඇත.

1.5.8 ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ ගණකාධිකාරි (වියදම්) සහ ගණකාධිකාරි (ආදායම්) ගේ මෙහෙය වීම යටතේ, ගෙවීම් ඒකකය, අයවැය ඒකකය, ආදායම් ඒකකය ලෙස ඒකක තුනක් යටතේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය ක්‍රියාත්මක වේ.

කාර්යභාරය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් එකතු කිරීම, ගිණුම් ගත කිරීම සහ අධීක්ෂණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කළමනාකරණය, පොදු තැන්පතු ගිණුම් කටයුතු සහ දෙපාර්තමේන්තුවට අයත් වත්කම් කළමනාකරණය සිදුකරයි. මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වියදම්, අනුමත ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව වියදම් දැරීම සඳහා මග පෙන්වීම සිදුකරන අතර වාර්ෂික සහ මාසික වාර්තාවන් ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, වාර්ෂික ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සහ පොදු තැන්පතු ගිණුම් වාර්තාව පිළියෙල කර නියමිත දිනයන්හි අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය හා අදාළ

අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතන වෙත ඉදිරිපත් කිරීම ඇතුලු දෙපාර්තමේන්තුවේ සියලුම මුල්‍ය කටයුතු මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම ගිණුම් අංශය තුළින් සිදුවේ.

(අ) ආදායම් හා ඉලක්කගත ප්‍රගතිය

2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුළු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 28.1 ක් වූ අතර 2023 වර්ෂයේ සත්‍ය වශයෙන් උපයන ලද මුළු ආදායම රුපියල් බිලියන 42.76 විය. 2022 වර්ෂයේ උපයන ලද මුළු ආදායම වන රු.බිලියන 23.83 සමග සැසදීමේදී 2023 වර්ෂයේ සියලුම ආදායම් ප්‍රභවයන්හි ඉහළ වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එම වර්ධනය 2023 වර්ෂයේ මුළු ආදායම රුපියල් බිලියන 42.76 දක්වා ඉහළයාමට හේතු විය.

(ආ) 2023 වර්ෂයේ සත්‍ය වියදම

2023 වර්ෂයේ දෙපාර්තමේන්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන **5,726.00**ක් විය. එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන **2,819.90** ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද, රුපියල් මිලියන **2,906.10**ක් මුලධන වියදම් වෙනුවෙන් ද අනුමත කර තිබුණි. 2023 වර්ෂයේ සමස්ථ සත්‍ය වියදම රුපියල් මිලියන **4,988.74**ක් වූ අතර එයින් රු.මිලියන **2,292.80**ක් පුනරාවර්තන වියදම් රු.මිලියන**2,695.94**ක් මූලධන වියදම් වෙනුවෙන් ද වැය කරන ලදී.

1.5.**9 අභ්‍යන්තර විගණන අංශය**

ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

අරමුණ

දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා මඟ පෙන්වීම, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම හා ස්වාධීන වූ සහතික කිරීම් හා උපදේශනයන් සැපයීම.

අභ්‍යන්තර විගණනයේ විෂය පථය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති සියලුම අංශ යටතට ගැනෙන සියලුම ක්ෂේත්‍ර සමාලෝචනය කිරීම, එම සමාලෝචනය කිරීමට අවශ්‍ය වාර්තා හා ලිපි ලේඛන පරීක්ෂා කිරීම, ගබඩා හා පුද්ගලයන් වෙත ප්‍රවේශ වීම හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත අදාළ වාර්තාකරණයන් සිදු කිරීම.

2023 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්

1. ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා

- ගෙවීම් වවුචර් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- දෙපාර්තමේන්තුවේ වියදම් කළමනාකරණය සම්බන්ධ කටයුතු හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- 1948 අංක 18 දරන පුරවැසි පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- මාසික ගිණුම් සාරාංශය හා ආශ්‍රිත වාර්තා පිළියෙළ කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- පුද්ගලික ලිපිගොනු නඩත්තුව සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- අනවසර පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, රටින් බැහැර කිරීම සඳහා නීතිමය කටයුතු කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.

- හිස් ගමන් බලපත්‍ර වල වර්තමාන තොග තත්ත්වය හා අනාගත අවශ්‍යතාවය සම්බන්ධ විශේෂ විගණනය.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණනය.
- අංශ වලට නිකුත් නොකර ගබඩාවේ තබා ඇති යන්ත්‍ර සම්බන්ධ විශේෂ පරීක්ෂාව.
- 2022/12/31 දිනට අත්තිකාරම් බී ගිණුම සම්බන්ධ විශේෂ පරීක්ෂාව.
- මාතර ප්‍රාදේශීය කාර්යාලය පිළිබඳ අභ්‍යන්තර විගණනය.
- දෙපාර්තමේන්තුවට අදාළ නඩු කටයුතු හා අධිකරණ කටයුතු ඉටු කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂාව.
- ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම්ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය.
- ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ නිසි ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ක්‍රියාවලිය අභ්‍යන්තර විගණනය.

2. ඉදිරිපත් කරන ලද විශේෂ වාර්තා

i. 2023 වර්ෂයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මූලික වාර්තාව සකස් කිරීම.
ii. 2022 අවසන් කාර්තුවේ හා 2023 වර්ෂයේ මුල් කාර්තු තුනට අදාළ ආදායම් විශ්ලේෂණ වාර්තා සකස් කිරීම.
iii. 2022 අවසන් කාර්තුවේ හා 2023 වර්ෂයේ මුල් කාර්තු තුනට අදාළ වියදම් විශ්ලේෂණ වාර්තා සකස් කිරීම.
iv. 2022 අවසන් කාර්තුවේ හා 2023 වර්ෂයේ මුල් කාර්තු තුනට අදාළ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තා සකස් කිරීම.

3. සෑම කාර්තුවකම දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

4. වෙනත් විශේෂ කාර්යයන්

i. 2024 වර්ෂය සඳහා අවදානම් ලේඛනය සකස් කිරීම
ii. 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම
iii. දෙපාර්තමේන්තු සුබසාධක සංගමයේ 2022 වර්ෂයේ වාර්ෂික ගිණුම් පරීක්ෂාව

ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන්

2024 වර්ෂය සඳහා අනුමත විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2023 වර්ෂයේදී අත්කරගත් ප්‍රගතිය

2.1.1. ගමන් බලපත්‍ර අංශය

ගමන් බලපත් නිකුත් කිරීමේ ප්‍රගතිය

දෛනිකව වැඩිම සේවාලාභීන් සංඛ්‍යාවක් පැමිණෙන ශාඛාව ගමන් බලපත්‍ර ශාඛාවයි. ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය වශයෙන් ගමන් බලපත් ලබා ගැනීම සඳහා මහනුවර, මාතර, වව්නියාව හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 4ක් පිහිටුවා ඇත. මෙම කාර්යාලවලින් එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යන ක්‍රම දෙකටම ගමන් බලපත් නිකුත් කරනු ලබයි.

2022 වර්ෂයේ වාර්තාගත ලෙස සේවාලාභීන් වැඩිවීම නිසා ඔවුන් සඳහා උපරිම සේවයක් සැලසීමේ අපේක්ෂාවෙන් 2023.06.15 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇත.

1. 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සියලුම ගමන් බලපත්‍ර සංඛ්‍යාව

රාජ්‍ය තාන්ත්‍රික	රාජකාරි	සියලුම රටවල්	හදිසි සහතික	හඳුනා ගැනීමේ සහතික	එකතුව
241	1,112	900,388	8,839	2	910,582

2. ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව

කාර්යාලය	රාජ්‍ය තාන්ත්‍රික	රාජකාරි	සියලුම රටවල්	හදිසි සහතික	එකතුව
මහනුවර	-	1	49,357	1,506	50,864
වව්නියාව	-	-	55,885	376	56,261
මාතර	-	-	38,407	894	39,301
කුරුණෑගල	-	1	44,496	634	45,131



3. **2023** වර්ෂය තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ නිකුත් කර ඇති ගමන් බලපත් සංඛ්‍යාව

හදිසි සේවාව	සාමාන්‍ය සේවාව	එකතුව
14,755	34,015	48,770

4. **2019** සිට 2023 දක්වා ගමන් බලපත් නිකුත් කිරීම් ගමන් බලපත් වර්ග අනුව

වර්ෂය	රාජ්‍යතාන්ත්‍රික	රාජකාරි	සියළු රටවල්	මැද පෙරදිග	හදිසි සහතික	හඳුනා ගැනීමේ සහතික	එකතුව
2019	314	1,585	545,883	3916	19,674	1	571,373
2020	175	404	204,081	13	4,738	-	209,411
2021	398	860	381,301	-	1	-	382,560
2022	249	711	910,138	-	590	1	911,689
2023	241	1,112	900,388	-	88,39	2	910,582
එකතුව	1377	4672	2,941,791	3,929	25,003	4	2,985,615



5. **2019** සිට 2023 දක්වා ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කළ ගමන් බලපත් සංඛ්‍යාව

කාර්යාලය	2019	2020	2021	2022	2023
මහනුවර	45,982	16,230	27,395	53,120	50,864
වව්නියාව	29,820	12,269	22,708	54,881	56,261
මාතර	32,109	11,353	20,754	48,464	39,301
කුරුණෑගල	29,589	11,451	22,306	50,680	45,131
එකතුව	137,500	51,303	93,163	207,145	191,557



2.1.1.2. ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

ප්‍රධාන කාර්යාලය මගින් සිදුකළ ගමන් බලපත්‍ර සංශෝධන

කාණ්ඩය	එකතුව
එක් විදේශ ගමනකට වලංගු කිරීම	261
තනි ගමන් සීමාව අවලංගු කිරීම	4878
ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කිරීම	246
ළමුන් ඉවත් කිරීම	15
ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම	9803
විවාහයට පෙර නම ඇතුළත් කිරීම	134
වාසගම/වෙනත් නම් සංශෝධනය	8087
විවාහයට පසු නම ඇතුළත් කිරීම	625
වෙනත් සංශෝධනය 1	7334
වෙනත් සංශෝධනය 2	41
තනතුර සටහන් කිරීම/තනතුර ඉවත්කිරීම	19826

2.1.1.3 විදේශ දූත මණ්ඩල ශාඛාවේ ප්‍රගතිය

1. 2023 වර්ෂය තුළ මෙම ශාඛාව මගින් ලියාපදිංචි කරන ලද, අනුමත කරන ලද සහ නිකුත් කරන ලද ගමන් බලපත් සංඛ්‍යාව

මාසය	ලියාපදිංචි කරන ලද	අනුමත කරන ලද	නිකුත් කරන ලද
ජනවාරි	5,068	3,000	5,634
පෙබරවාරි	5,066	3,691	2,886
මාර්තු	6,591	4,081	5,019
අප්‍රේල්	4,686	5,520	3,543
මැයි	5,157	6,050	8,815
ජූනි	5,378	5,767	5,170
ජූලි	4,094	5,898	4,800
අගෝස්තු	5,072	6,067	7,220
සැප්තැම්බර්	4,482	3,809	4,412
ඔක්තෝබර්	4,745	5,044	3,475
නොවැම්බර්	4,675	5,433	3,943
දෙසැම්බර්	3,831	4,873	2,875
එකතුව	**58,845**	**59,233**	**57,792**



2. 2023 වර්ෂය තුළ මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත් සංඛ්‍යාව

මාසය	සංඛ්‍යාව
ජනවාරි	5,634
පෙබරවාරි	2,886
මාර්තු	5,019
අප්‍රේල්	3,543
මැයි	8,815
ජුනි	5,170
ජූ ලි	4,800
අගෝස්තු	7,220
සැප්තැම්බර්	4,412
ඔක්තෝබර්	3,475
නොවැම්බර්	3,943
දෙසැම්බර්	2,875
එකතුව	**57,792**



3. 2019 වර්ෂයේ සිට 2023 වසර දක්වා විදේශ දූත මණ්ඩල අංශය මගින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ තොරතුරු

මාසය	2019	2020	2021	2022	2023
ජනවාරි	3,785	3,610	1,983	5,592	5,634
පෙබරවාරි	2,681	4,370	2,793	3,290	2,886
මාර්තු	4,035	2,243	6,148	4,487	5,019
අප්‍රේල්	4,088	3,112	3,411	5,003	3,543
මැයි	5,448	1,935	6,582	6,115	8,815
ජුනි	3,858	3,147	8,815	5,731	5,170
ජූලි	3,684	3,155	5,983	6,323	4,800
අගෝස්තු	3,778	3,630	5,580	6,006	7,220

මාසය	2019	2020	2021	2022	2023
සැප්තැම්බර්	3,593	5,583	4,011	4,080	4,412
ඔක්තෝබර්	4,052	5,290	5,956	661	3,475
නොවැම්බර්	3,142	4,331	4,186	5,322	3,943
දෙසැම්බර්	2,950	2,795	5,440	5,469	2,875
එකතුව	**45,094**	**43201**	**60,888**	**58,079**	**57,792**



2023 වර්ෂයේ සිදු කරන ලද විශේෂ වැඩසටහන්

- ඉන්දියාවේ පුනරුත්ථාපන කඳවුරුවල සිටින අවතැන් වූ ශ්‍රී ලාංකිකයන්ට විදේශ ගමන් විදෙස් ගමන් බලපත් නිකුත් කිරීමේ විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

2.1.2 වීසා ශාඛාව

1. 2023 වර්ෂය තුළ විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම්, නව වීසා නිකුත් කිරීම් සහ දීර්ඝ කිරීම්වලට අදාළ ප්‍රගතිය

විස්තරය	සංඛ්‍යාව
ඉ - සංචරණ අනුමැතිය ලබාදීම	1,635,268
වාස වීසා නිකුත් කිරීම්	23,311
වාස වීසා දීර්ඝ කිරීම්	22,639
කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම් (සංචාරක, ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් වීසා)	27,941
ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම (ශ්‍රී ලාංකික)	3,633

2. 2017 සිට 2023 වර්ෂය දක්වා විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම්, නව වීසා නිකුත් කිරීම් සහ දීර්ඝ කිරීම්වලට අදාළ ප්‍රගතිය

විස්තරය	2017	2018	2019	2020	2021	2022	2023
ඉ - සංචරණ අනුමැතිය ලබාදීම	2,392,219	2,307,541	1,533,386	374,068	234,313	691,427	1,635,268
වාස වීසා නිකුත් කිරීම්	28,044	27,395	23,219	9,294	15,861	23,318	23,311
වාස වීසා දීර්ඝ කිරීම්	26,949	29,948	34,596	29,691	28,595	27,392	22,639
කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම් (සංචාරක, ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් වීසා)	58,220	63,452	61,031	31,985	20,246	41,775	27,941
ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම (ශ්‍රී ලාංකික)	2,598	1,478	1,488	339	468	998	3,633

3. වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තරාත්මක සටහන - 2023

අනු. අංකය	වාස වීසා වර්ගය	දීර්ඝ කිරීම්	නිකුත් කිරීම්	තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ	ගුවන් තොටුපළ වෙත යවනු ලැබූ පණිවුඩ
01	ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතනවල සේවයේ නියුතු	3,551	1,662	1,750	51
02	ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන්	268	249	0	0
03	පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ	0	1,394	0	0
04	පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ	0	533	0	0
05	ආයෝජක - කාණ්ඩය B	9	17	0	0
06	ආයෝජක - කාණ්ඩය C	74	68	9	1
07	පූජ්‍ය පක්ෂය	787	276	189	23
08	උසාවි නියෝග	144	23	0	0
09	කලින් ශ්‍රී ලාංකිකයන්ව සිටි	2,098	2,775	0	0
10	වෛද්‍ය හේතූන් මත පැමිණි	673	422	8	1
11	රාජ්‍ය නොවන සංවිධාන (INGO)	288	199	158	97
12	රාජ්‍ය නොවන සංවිධාන (NGO)	117	76	76	31
13	ආගමික වෘත්තිකයින්	82	81	125	10
14	පුද්ගලික අංශයේ සේවයේ නියුතු	5,998	13,273	4,765	384
15	ලියාපදිංචි ඉන්දියානුවන්	8	2	0	0
16	රාජ්‍ය අංශය	1,278	949	651	403
17	ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන්	3,835	1,729	0	0
18	ආගන්තුක (R G S)	10	1	0	0
19	රන් පාරාදීසය (GOLDEN PARADISE)	1	6	0	0
20	සේවයේ නියුතු විදේශීය කලත්‍රයන්	5	2	0	0
21	මාගේ සිහින නිවහන (SSRV)	179	24	0	0
22	රාජකාරි	171	240	238	37
23	අධ්‍යාපනික	3,057	1,213	994	104
24	ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ යැපෙන්නන්	4	6	0	0
25	SAARC වීසා	0	117	0	0
26	කොළඹ වරාය නගරය	0	0	0	4
27	සහාදිපත්‍ය දේපළ	0	11	0	0
28	ශ්‍රී ලාංකික දරුවන්ගේ දෙමාපියන්	2	7	0	0
	එකතුව	**22,630**	**23,849**	**8,854**	**1,146**

රටවල් හතක් සඳහා ගාස්තු රහිත සාවාරක වීසා ලබා දීම

ලොව ප්‍රධාන පෙලේ ආර්ථිකයන්ට හිමිකම් කියනු ලබන රටවල්, කොවිඩ් වසංගත තත්ත්වය නිමා වීමත් සමඟ තම පුරවැසියන් යළි විදේශ රටවල සංචාරය සඳහා විවෘත කෙරෙමින් පවතී. එබැවින් බොහෝමයක් ආසියානු සංචාරක ගමනාන්තයන් ඒ සඳහා තරගකාරීත්වයකට එළඹ ඇති බැවින් අප රටේ ද අහිමි වූ වෙළෙඳපොළ අවස්ථා වර්ධනය කර ගැනීමට ආගමන හා විගමන ක්‍රියාවලින් වඩාත් සුමට කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2023.11.28 දින සිට චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, රුසියාව, තායිලන්තය, මැලේසියාව හා ජපානය යන රටවල් හත සඳහා සංචරණ වීසා නොමිලේ ලබා දීමට ක්‍රියා කරන ලදී. මෙම ක්‍රමය 2024.03.31 දක්වා වලංගු වේ. ඒ අනුව එම රටවල් හතෙහි සංචාරකයන්ගේ පැමිණීම පහත වගුව අනුව දක්වා ඇත.

රට	පැමිණීමේ (On Arrivals)		මාර්ගගතව (Online)	
	2022.11.28 - 2022.12.31	2023.11.28 - 2023.12.31	2022.11.28 - 2022.12.31	2023.11.28 - 2023.12.31
රුසියාව	9,132	6,851	14,324	33,886
ඉන්දියාව	1,410	9,412	13,747	37,097
ඉන්දුනීසියාව	25	68	109	195
ජපානය	152	350	624	2,712
මැලේසියාව	74	355	433	1,487
තායිලන්තය	30	82	265	573
චීනය	23	423	605	11,307
මුළු ගණන	**10,846**	**17,541**	**30,107**	**87,257**

ගාස්තු රහිත සංචාරක වීසා ක්‍රියාත්මක කිරීමෙන් පසු සංචාරකයින්ගේ පැමිණීමට පෙර වසර හා සංසන්දනය

2.1.3 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යාන්ත පාලන

2.1.3.1 තොරතුරු තාක්ෂණ අංශය

1. ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය(IEMS)මගින් ප්‍රතිචාර දැක්වූ විමසුම් පිළිබඳ තොරතුරු

අංකය	ආයතනය	එකතුව
01	ජර්මානු තානාපති කාර්යාලය	08
02	නවදිල්ලියේ පිහිටි නෝර්විජියානු තානාපති කාර්යාලය	21
03	ඇමරිකානු තානාපති කාර්යාලය	33
04	ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය	18
05	කැනඩා මහ කොමසාරිස් කාර්යාලය	166
06	එක්සත් රාජධානියේ මහ කොමසාරිස් කාර්යාලය	145
07	ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය බ්‍රිතාන්‍ය	65
08	ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය	98
09	නොර්වේ තානාපති කාර්යාලය	01
	එකතුව	**555**

(02) නැවත භාරගැනීමේ ගැටළු කළමනාකරණ පද්ධතිය(RCMS)

2023.01.01 දින සිට 2023.12.31 දක්වා කාලය තුළ, මෙම දෙපාර්තමේන්තුව මඟින් පුද්ගලයන්ගේ ශ්‍රී ලාංකිකත්වය තහවුරු කර, තාවකාලික ගමන් ලියවිලි නිකුත් කිරීම සඳහා ශ්‍රී ලාංකික තානාපති කාර්යාල වෙත නිකුත් කර ඇති නිර්දේශ සම්බන්ධ විස්තර පහතින් දැක්වේ.

රට	**RCMS මඟින් ශ්‍රී ලාංකිකත්වය තහවුරු කර නිර්දේශ කරන ලද සංඛ්‍යාව 2023.12.31 දිනට**
ඕස්ට්‍රේලියාව	156
ඔස්ට්‍රියාව	2
බහරේන්	13
බෙල්ජියම	2
කැනඩාව	53
චීනය	5
ඩුබායි	572
ෆීජීප්තුව	26
පින්ලන්තය	1
ප්‍රංශය	191
ජර්මනිය	66
ඉන්දුනීසියාව	31
ඉරානය	2
ඉතාලිය	39
ජපානය	17
කෙන්යාව	5
කුවේට්	4,405
මැලේසියාව	72
මියැන්මාරය	5
නේපාලය	5
නෙදර්ලන්තය	2
ඕමානය	610
පිලිපිනය	1
පෝලන්තය	10
කටාර්	532
රුමේනියා	40
රුසියානු සමූහාණ්ඩුව	35
සවුදි අරාබියාව	670
සිංගප්පූරුව	1
ස්වීඩනය	3
ස්විට්සර්ලන්තය	134
තායිලන්තය	14
තුර්කිය	30
එක්සත් රාජධානිය	51
ඇමරිකා එක්සත් ජනපදය	5
වියට්නාමය	121
එකතුව	**7,927**

2.1.3.2 තොටුපළ ශාඛාව

1. අනුමත එක් එක් තොටුපළවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2023

තොටුපළ	පැමිණි සංඛ්‍යාව	පිටත් වූ සංඛ්‍යාව	එකතුව
කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපළ	2,825,823	3,008,092	**5,833,915**
හම්බන්තොට වරාය	14,706	7,174	**21,880**
මත්තල ගුවන් තොටුපළ	64,877	61,582	**126,459**
කොළඹ වරාය	36,462	36,117	**72,579**
ගාල්ල වරාය	8,855	8,398	**17,253**
නොරොච්චෝලේ වරාය	97	93	**190**
ත්‍රිකුණාමලය වරාය	2,435	2,622	**5,057**
රත්මලාන ගුවන් තොටුපළ	6	8	**14**
යාපනය ගුවන් තොටුපළ	**13,804**	**14,795**	**28,599**
එකතුව	**2,967,065**	**3,138,881**	**6,105,946**





2. ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2023

මාසය	පැමිණි සංඛ්‍යාව			පිටත් වූ සංඛ්‍යාව		
	ශ්‍රී ලාංකික පුරවැසියන්	විදේශිකයන්	පැමිණි මුළු සංඛ්‍යාව	ශ්‍රී ලාංකික පුරවැසියන්	විදේශිකයන්	පිටත්වූ මුළු සංඛ්‍යාව
ජනවාරි	97,823	119,587	217,410	110,872	122,326	233,198
පෙබරවාරි	83,000	121,075	204,075	106,595	118,256	224,851
මාර්තු	92,801	140,383	233,184	118,514	145,276	263,790
අප්‍රේල්	102,341	121,373	223,714	110,123	137,313	247,436
මැයි	99,172	100,444	199,616	122,661	108,882	231,543
ජූනි	119,084	119,142	238,226	114,598	104,307	218,905
ජූලි	126,367	165,027	291,394	130,295	140,020	270,315
අගෝස්තු	110,100	156,440	266,540	144,377	178,337	322,714
සැප්තැම්බර්	99,853	130,074	229,927	148,424	141,343	289,767
ඔක්තෝබර්	99,100	127,355	226,455	122,185	132,500	254,685
නොවැම්බර්	106,060	170,292	276,352	119,433	154,381	273,814
දෙසැම්බර්	125,988	234,386	360,374	126,721	188,076	314,797
එකතුව	**1,261,689**	**1,705,578**	**2,967,267**	**1,474,798**	**1,671,017**	**3,145,815**

ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2023



ශ්‍රී ලංකාවෙන් පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛාව මාසිකව - 2023



3. ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2023

මාසය	අප්‍රිකාව	ආසියාව	ඕස්ට්‍රේලියාව	යුරෝපය	උතුරු ඇමරිකාව	දකුණු ඇමරිකාව	හඳුනා නොගත්	එකතුව
ජනවාරි	764	32,673	7,025	70,754	7,993	304	74	**119,587**
පෙබරවාරි	792	33,224	5,163	74,790	6,766	255	85	**121,075**
මාර්තු	949	45,022	7,458	75,309	11,161	351	133	**140,383**
අප්‍රේල්	1,246	45,098	8,483	57,325	8,648	479	94	**121,373**
මැයි	751	47,412	7,395	35,919	8,553	264	150	**100,444**
ජූනි	1,273	56,399	10,168	40,591	10,316	265	129	**119,141**
ජූලි	1,611	63,538	9,487	78,194	11,849	230	118	**165,027**
අගෝස්තු	1,611	67,914	8,750	68,337	9,473	284	71	**156,440**
සැප්තැම්බර්	984	64,147	9,850	48,602	6,052	245	194	**130,074**
ඔක්තෝබර්	1,240	60,881	8,247	50,367	6,147	284	189	**127,355**
නොවැම්බර්	1,391	66,007	11,618	82,376	8,432	350	118	**170,292**
දෙසැම්බර්	2,730	90,663	17,831	108,746	13,801	509	106	**234,386**
එකතුව	**15,342**	**672,978**	**111,475**	**791,310**	**109,191**	**3,820**	**1,461**	**1,705,577**

ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2023



ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2022



4. ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2023

තොටුපල	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
කටුනායක ගුවන් තොටුපළ	97,009	81,880	92,107	101,397	98,248	117,999	125,519	109,082	98,696	97,976	105,055	124,997	***1,2449,965***
හම්බන්තොට වරාය	0	5	0	5	23	27	45	46	2	15	34	42	***244***
මත්තල ගුවන් තොටුපළ	0	0	0	81	79	0	0	0	0	1	123	1	***285***
කොළඹ වරාය	220	338	70	97	199	368	70	52	52	37	83	81	***1,667***
ගාල්ල වරාය	80	75	56	88	80	84	87	68	60	66	62	74	***880***
නොරොච්චෝලේ වරාය	0	0	0	0	0	0	0	0	0	0	0	0	***0***
ත්‍රිකුණාමලය වරාය	0	0	8	0	1	15	0	18	14	0	0	0	***56***
රත්මලාන ගුවන් තොටුපළ	0	0	0	1	0	0	0	0	0	0	0	0	***1***
යාපනය ගුවන් තොටුපළ	514	702	560	672	542	591	646	834	1,029	878	703	793	***8,464***
කන්කසන්තුරේ වරාය	0	0	0	0	0		0	0	0	127	0	0	***127***
එකතුව	**97,823**	**83,000**	**92,801**	**102,341**	**99,172**	**119,084**	**126,367**	**110,100**	**99,853**	**99,100**	**106,060**	**125,988**	**1,261,689**

5. ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2023

තොටුපල	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
කටුනායක ගුවන් තොටුපළ	112,603	113,166	126,824	107,434	90,440	108,776	159,344	147,383	122,744	122,009	151,265	213,870	**1,575,858**
හම්බන්තොට වරාය	61	28	26	388	3,205	2,648	29	3,954	2,293	26	46	1,758	**14,462**
මත්තල ගුවන් තොටුපළ	3,790	6,382	7,626	5,398	4,226	3,621	3,656	3,229	3,617	3,658	8,957	10,432	**64,592**
කොළඹ වරාය	1,718	575	3,363	7,256	1,620	2,276	619	438	312	414	9,040	7,164	**34,795**
ගාල්ල වරාය	1,003	608	1,235	603	584	562	604	545	461	600	528	642	**7,975**
නොරොච්චෝලේ වරාය	6	0	14	21	0	0	0	0	47	4	0	5	**97**
ත්‍රිකුණාමලය වරාය	122	16	959	24	16	867	117	26	16	96	105	15	**2,364**
රත්මලාන ගුවන් තොටුපළ	3	0	0	2	0	0	0	0	0	0	0	0	**5**
යාපනය ගුවන් තොටුපළ	281	300	336	247	353	392	658	865	584	473	351	500	**5,340**
කන්කසන්තුරේ වරාය	0	0	0	0	0	0	0	0	0	75		0	**75**
එකතුව	**119,587**	**121,075**	**140,383**	**121,373**	**100,444**	**119,142**	**165,027**	**156,440**	**130,374**	**127,355**	**170,292**	**234,386**	**1,705,878**

6. ශ්‍රී ලංකාවෙන් පිටවූ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2023

තොටුපළ	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
කටුනායක ගුවන් තොටුපළ	**109,496**	**105,811**	**117,619**	**109,325**	**121,603**	**121,603**	**129,329**	**143,178**	**147,344**	**120,954**	**118,506**	**125,615**	***1,462,246***
හම්බන්තොට වරාය	**2**	**5**	**0**	**20**	**16**	**175**	**47**	**12**	**20**	**13**	**50**	**22**	***382***
මත්තල ගුවන් තොටුපළ	**0**	**0**	**1**	**1**	**0**	**0**	**0**	**0**	**1**	**0**	**134**	**0**	***137***
කොළඹ වරාය	**497**	**55**	**72**	**105**	**194**	**219**	**88**	**49**	**55**	**48**	**39**	**77**	***1,498***
ගාල්ල වරාය	**117**	**80**	**68**	**60**	**109**	**68**	**105**	**72**	**84**	**75**	**56**	**118**	***1,012***
නොරොච්චෝලේ වරාය	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	***0***
ත්‍රිකුණාමලය වරාය	**0**	**0**	**6**	**0**	**17**	**0**	**16**	**12**	**0**	**0**	**0**	**0**	***51***
රත්මලාන ගුවන් තොටුපළ	**0**	**0**	**0**	**1**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	***1***
යාපනය ගුවන් තොටුපළ	**760**	**644**	**748**	**611**	**739**	**653**	**726**	**1,050**	**906**	**1,025**	**648**	**889**	***9,399***
කන්කසන්තුරේ වරාය	***0***	***0***	***0***	***0***	***0***	***0***	***0***	***0***	***2***	***70***	***0***	***0***	***72***

7. ශ්‍රී ලංකාවෙන් පිටවූ විදේශිකයින් සංඛ්‍යාව තොටුපළ හා මාස අනුව - 2023

තොටුපළ	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
කටුනායක ගුවන් තොටුපළ	115,765	110,765	131,976	122,606	99,244	94,381	134,451	171,768	132,539	127,518	136,108	168,725	*1,545,846*
හම්බන්තොට වරාය	1,177	20	22	6	47	44	38	32	33	39	640	4,694	*6,792*
මත්තල ගුවන් තොටුපළ	2,916	5,797	7,683	6,437	3,994	3,619	3.657	3,218	3,680	3,281	7,996	9,167	*61,445*
කොළඹ වරාය	1,338	612	4,253	7,355	4,610	1,872	586	467	443	453	8,492	4,138	*34,619*
ගාල්ල වරාය	859	703	1,001	550	570	540	523	465	481	550	609	535	*7,386*
නොරොච්චෝලේ වරාය	3	0	13	33	22	0	0	0	14	4	0	4	*93*
ත්‍රිකුණාමලය වරාය	103	19	28	22	12	1,599	55	79	13	95	142	404	*2,571*
රත්මලාන ගුවන් තොටුපළ	3	0	0	2	1	1	0	0	0	0	0	0	*7*
යාපනය ගුවන් තොටුපළ	162	340	300	302	382	389	710	844	651	513	394	409	*5,396*
කන්කසන්තුරේ වරාය	0	0	0	0	0	1,862	0	1,464	3,489	47	0	0	*6,862*
එකතුව	*122,326*	*118,256*	*145,276*	*137,313*	*108,882*	*104,307*	*140,020*	*178,337*	*141,343*	*132,500*	*154,381*	*188,076*	*1,671,017*

8. රට තුළට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused entry) - 2023

ජාතිය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
අප්‍රෙඋගන්ඩියන්	3											
මෝල්ඩිවියන්	1	1	2						1		1	1
ඉන්දියන්	4	3	5	5	8	13	8	10	18	18	1	11
පාකිස්තානි	1	2	3	3	7	1	2	2		3	2	
ඊශ්‍රායලි	1					1			1			
කොලොම්බියන්		2										
ඝානියන්		1							1			
ඩොමිනිකන්		1		2								
කසකස්ටානි		1										
මොරොක්කන්		5										
ෆ්‍රෙන්ච්			1				1	1				
චයිනීස්			4	4		2		1	2	1	3	
නේපාලීස්			1			1		2	4	1		9
ටඅකිස්			1							1	1	

ජාතිය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
බංග්ලාදේසි			2	6					13		1	4
නමීබියන්			2									
ඉරාකි				2		1						
ඉරානියන්				1								
නයිජීරියන්				1								
හයිටියන්				1								
රසියන්				2		4		2		3	2	
යේමනි				1	1							
කැනේඩියන්				1				1				
ලිබියන්				1								
ඩොයිෂ්					1							
උස්බෙක්					2	1		1			1	1
ඉන්දුනීසියන්					1							
ඕස්ට්‍රේලියන්					1							
ඉක්වදොරියන්					2							
පලස්ටිනියන්							1					
සවුත් අෆ්රි කන්							1					
ඉතාලියන්								1				
ගයනීස්								1				
තායි									1			
මැලේසියන්									1			
ග්‍රීක්										1		
බ්‍රිටිෂ්											1	
ඩච්											1	
කාම්බෝඩියන්											1	
බෙල්ජියම්												1

විදේශිකයන්ට රට තුළට ඇතුල්වීමට අවසර ලබා නොදීමට හේතු:-

1. නිර්ව්‍යාජ සංචාරකයකු නොවීම
2. ව්‍යාජ ගමන් බලපත්‍ර භාවිතය
3. විධිමත් වීසාවක් ලබා නොතිබීම(වීසා ලබාදිය නොහැකි රටවල් හා වෙනත්)
4. මීට පෙර ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම මත මෙරටින් ඉවත් කර තිබීම
5. අසාධු ලේඛණගත කිරීම
6. විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා නොතිබීම. (No ETA)

7. ප්‍රමාණවත් මුදල් නොතිබීම
8. ආපසු යාමේ ගුවන් ටිකට් පත නොමැති වීම
9. ජාත්‍යන්තර පොලීසියේ රතු දත්ත හා නිවේදන
10. අධිකරණ නියෝග
11. ආගමන හා විගමන පාලක ජනරාල්ගේ නියෝග

9. ගමන් බලපත්‍ර ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීම සඳහා (කූරියර් කිරීම) අනුමැතිය දීම.

ආගාමික හා විගාමික පනතට අනුව ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ගමන් බලපත්‍ර හිමිකරු නොමැතිව ගමන් බලපත්‍රයක් තැපෑලෙන් හෝ අන් අයුරකින් වෙනත් රටකට යැවීම නීතිවිරෝධී වේ. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ තානාපති කාර්යාල පිහිටා නොමැති රටවලට ඇතුළුවීමට අවශ්‍ය වන වීසා ලබාගැනීම සඳහා එම රටවල්වල තානාපති කාර්යාල පිහිටා ඇති රටකට ගමන් බලපත්‍ර යැවීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා දේ. (උදා: නවසීලන්ත වීසා ලබාගැනීම සඳහා ඉන්දියාවේ නවදිල්ලි නුවර නවසීලන්ත මහ කොමසාරිස් කාර්යාලය වෙත ගමන් බලපත්‍ර කූරියර් කරනු ලැබේ.)

ඒ අනුව 2019 වර්ෂය තුලදී ගමන් බලපත්‍ර 19334 ක් දෙපාර්තමේන්තු අනුමැතිය යටතේ කූරියර් කිරීමට අවසර ලබා දී ඇති අතර, ඒ සඳහා එක් ගමන් බලපත්‍රයක් වෙනුවෙන් රු:1000.00 ක මුදලක් අය කර ඇති අතර, 2019.07.01 දින සිට එක් ගමන් බලපත්‍රයක් වෙනුවෙන් රු:1150.00 ක මුදලක් අය කරනු ලැබේ. එමගින් රු:20,376,650.00 (රුපියල් මිලියන 20.37665) ආදායමක් උපයා ඇත.

2023 අයවැය යෝජනා අනුව ගුවන් ගමන් බලපත්‍ර කූරියර් සේවාව මඟින් විදේශ රටවලට යැවීම සඳහා රු.2, 000/- ක මුදලක් අය කිරීමට යෝජනා වූ අතර එය 17.11.2022 දින සිට ක්‍රියාත්මක විය.

10. 2023 වර්ෂය තුලදී කූරියර් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති ගමන් බලපත්‍ර සංඛ්‍යාව

මාසය	කූරියර් කළ ප්‍රමාණය	ආදායම (ඒකක වටිනාකම රු: 2,000.00)
ජනවාරි	689	1,378,000
පෙබරවාරි	812	1,624,000
මාර්තු	1,111	2,222,000
අප්‍රියෙල්	776	1,552,000
මැයි	1,080	2,160,000
ජූනි	912	1,824,000
ජූලි	1,022	2,044,000
අගෝස්තු	1,249	2,498,000
සැප්තැම්බර්	1,031	2,060,000
ඔක්තෝබර්	798	1,596,000
නොවැම්බර්	698	1,396,000
දෙසැම්බර්	707	1,414,000
එකතුව	**10,885**	**21,770,000**

කුරියර් කළ ගමන් බලපත්‍ර ප්‍රමාණය මාස අනුව සැසඳීම 2022 – **2023**



11. ගමන් බලපත්‍ර කුරියර් කිරීම 2014 – **2023**

වර්ෂය	කුරියර් කළ ප්‍රමාණය	ආදායම (ඒකක වටිනාකම රු:1000.00 / රු:1150.00/ රු:2,000.00)
2014	26,286	26,286,000
2015	28,820	28,820,000
2016	30,676	30,676,000
2017	30,529	30,529,000
2018	26,718	26,718,000
2019	19,334	20,376,650
2020	2,422	2,785,300
2021	3,734	4,294,100
2022	8,803	11,060,150
2023	10,885	21,770,000
එකතුව	177,322	181,545,200

දූතායන අදායම රුපියල් 2014 සිට 2023



12. ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම

කොටුපල	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
කොළඹ වරාය	86,102	91,122	86,753	88,158	61,664	68,844	6,941	28	7,614	**21,185**
ගාල්ල වරාය	1,696	2,177	2,269	1341	1,596	1,246	69	0	140	**466**
නොරොච්චෝලේ වරාය	--	--	--	--	209	248	86	0	0	**0**
ත්‍රිකුණාමලය වරාය	0	105	0	0	2,334	1,733	315	0	144	**1,377**
හම්බන්තොට වරාය	--	--	--	--	345	589	106	12	1,377	**1,432**
එකතුව	**87,798**	**93,404**	**89,022**	**89,499**	**66,148**	**72,*660***	***7,517***	**40**	**9,175**	**24,460**

විදේශික නාවික කාර්යමණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම

සියළුම නාවික කාර්ය මණ්ඩලවල සෑම සාමාජිකයෙකුම රටට ඇතුළුවීමට ප්‍රථම බැඳුම්කරයකට අත්සන් කළ යුතු වන අතර, ඒ සඳහා රුපියල් 1000.00 ක බැඳුම්කර ගාස්තුවක් අයකර ඇති අතර, 2019.07.01 දින සිට රු:1150.00 ක මුදලක් අය කෙරේ. **එසේම, නාවික කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අය කරන බැඳුම්කර ගාස්තුව ඇමරිකානු ඩොලර් 25ක් ලෙස සංශෝධනය වී ඇත.මෙය 01.12.2022 දින සිට ක්‍රියාත්මක විය.**

ශ්‍රී ලංකාවට පැමිණෙන නැව්වල සේවයට යන විදේශිකයින් හා නැව්වල සේවය කර ශ්‍රී ලංකාවෙන් බැහැර වන විදේශිකයින් සඳහා මෙම බැඳුම්කර නිකුත් කරන අතර, අදාළ බැඳුම්කර ගාස්තුව රටට ඇතුළුවන්නාගේ මෙරට නියෝජිතයා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. අදාල ගාස්තු ගෙවීමෙන් පසු තීරු සංකේත සහිත ස්ටිකරයක් නියෝජිතයා වෙත නිකුත් කරනු ලැබේ.

13. නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම - මාසිකව ආදායම 2023

මාසය	නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය	ආදායම (ඒකක වටිනාකම රු:1,150.00/US$25)
ජනවාරි	1,452	13,510,568
පෙබරවාරි	1,825	16,890,030
මාර්තු	2,084	17,576,126
අප්‍රේල්	1,823	15,018,851
මැයි	2,052	16,291,396
ජූනි	2,556	19,825,948
ජූලි	2,242	18,381,117
අගෝස්තු	1,719	14,088,423
සැප්තැම්බර්	934	7,663,524
ඔක්තෝබර්	1,882	15,508,224
නොවැම්බර්	1,925	16,015,000
දෙසැම්බර්	2,302	19,074,500
එකතුව	**22,796**	**189,843,707**

නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) මාසික ආදායම 2023



14. නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) මාසික ආදායම සැසඳීම 2022 – **2023**

වර්ෂය	නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය	ආදායම (ඒකක වටිනාකම රු:1000.00 / රු:1150.00/US$25)
2014	46,194	46,194,000
2015	44,841	44,841,000
2016	35,573	35,573,000
2017	37,532	37,532,000
2018	38,173	38,173,000
2019	34,941	37,179,000
2020	24,881	28,613,150
2021	28,967	33,312,050
2022	33,111	41,305,706
2023	22,796	189,843,708

නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) මාසික ආදායම සැසඳීම 2022 – **2023**



15. නෞකා කාර්ය මණ්ඩලය පිටවීම - 2023

මාසය	කොළඹ වරාය	ගාල්ල වරාය	ත්‍රිකුණාමලය වරාය	නොරොච්චෝලේ වරාය	හම්බන්තොට වරාය	එකතුව
ජනවාරි	577	795	-	03	51	**1,426**
පෙබරවාරි	636	572	17	-	23	**1,248**
මාර්තු	586	749	34	13	22	**1,404**
අප්‍රේල්	497	570	22	22	26	**1,137**
මැයි	584	664	12	-	49	**1,309**
ජූනි	589	615	73	-	219	**1,496**
ජූලි	731	623	68	-	67	**1,489**
අගෝස්තු	494	491	37	-	30	**1,052**
සැප්තැම්බර්	469	521	19	14	46	**1,069**
ඔක්තෝබර්	419	596	94	04	36	**1,149**
නොවැම්බර්	565	618	45	-	32	**1,260**
දෙසැම්බර්	591	612	32	04	53	**1,292**
එකතුව	**6,738**	**7,426**	**453**	**60**	**654**	**15,331**

16. නෞකා කාර්ය මණ්ඩලය පැමිණීම - 2023

මාසය	කොළඹ වරාය	ගාල්ල වරාය	ත්‍රිකුණාමලය වරාය	නොරොච්චෝලේ වරාය	හම්බන්තොට වරාය	එකතුව
ජනවාරි	435	798	05	06	11	1,255
පෙබරවාරි	695	557	15	-	32	1,299
මාර්තු	563	667	35	08	24	1,297
අප්‍රියෙල්	574	651	24	21	10	1,280
මැයි	503	613	15	-	43	1,174
ජූනි	440	628	69	-	50	1,187
ජූලි	548	634	86	-	73	1,341
අගෝස්තු	448	511	25	-	79	1,063
සැප්තැම්බර්	358	467	20	23	27	895
ඔක්තෝබර්	370	616	97	04	11	1,098
නොවැම්බර්	445	522	58	-	32	1,057
දෙසැම්බර්	508	678	32	04	86	1,308
එකතුව	5,887	7,342	481	65	478	14,253

17. නෞකා කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම 2016 – **2023**

අනුමත වරායන්	2017		2018		2019		2020		2021		2022		2023	
	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම	පැමිණීම	පිටවීම
කොළඹ වරාය	5,945	6,020	6,908	6,554	5,989	6,264	4,064	3,130	2,984	3,481	2,984	3,481	5,887	6,738
ගාල්ල වරාය	14,135	12,334	15,417	13,328	13,956	11,614	12,206	10,125	12,284	12,284	12,851	12,740	7,342	7,426
ත්‍රිකුණාමලය වරාය	626	821	514	751	499	557	236	270	149	633	466	455	481	453
නොරොච්චෝලේ වරාය	167	144	213	175	85	99	61	50	34	42	36	38	65	60
හම්බන්තොට වරාය	43	31	142	88	136	76	416	151	222	222	222	222	478	654
එකතුව	**20,916**	**19,350**	**23,194**	**20,896**	**20,665**	**18,610**	**16,983**	**13,726**	**15,673**	**16,662**	**16,559**	**16,936**	**14,253**	**15,331**

18. `විදේශගත වූ මහීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුලත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම 2016 – **2023**

වර්ෂය	ලිපි සංඛ්‍යාව SLBFE
2016	6,483
2017	5,672
2018	4,884
2019	3,431
2020	723
2021	1,921
2022	4,839
2023	4,376

විවිධ ආයතන වලට නිකුත් කළ ලිපි සංඛ්‍යාව 2016 සිට 2023



19. **ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපලවල දී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබා දීම**

	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
ටුනායක ගුවන් තොටුපල	833,506	443,748	448,811	407,964	428,775	635,054	115,692	13,081	6,494	305,476

පැමිණීමේදී ETA නිකුත් කිරීම - කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ



2.1.4 විමර්ශන ශාඛාව

2.1 2023 වසරේ ක්ෂේත්‍ර ආවේක්ෂණ හා දුරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලි හරහා විමර්ශනයට ලක් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව

මාසය	ක්ෂේත්‍ර ආවේක්ෂණය	දුරස්ථ ආවේක්ෂණය	පරීක්ෂා කළ මුළු සංඛ්‍යාව	වැඩිදුර විමර්ශන සඳහා යොමු කළ
ජනවාරි	222	266	488	31
පෙබරවාරි	62	152	214	43
මාර්තු	42	173	215	36
අප්‍රේල්	36	95	131	19
මැයි	23	53	76	9
ජූනි	60	79	139	9
ජූලි	124	71	195	75
අගෝස්තු	68	107	175	19
සැප්තැම්බර්	53	76	129	26
ඔක්තෝම්බර්	28	52	80	89
නොවැම්බර්	25	44	69	31
දෙසැම්බර්	42	-	42	32
එකතුව	**785**	**1168**	**1953**	**419**

❖ 2023 වර්ෂයට අදාළව ක්ෂේත්‍ර ආවේක්ෂණ තුළින් විමර්ශනයන්ට ලක් කළ සහ දුරස්ථ ආවේක්ෂණය තුළින් විපරම් ලේඛනයට ඇතුළත් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව 1953 වන අතර, ඒ අතරින් එම වර්ෂයට අදාළව විදේශිකයන් 419 දෙනෙකු සඳහා වැඩිදුර විමර්ශන කටයුතු මෙහෙයවා ඇත.

2.2 දුරස්ථ ආවේක්ෂණය හරහා වීසා දිගු කිරීම් ප්‍රතික්ෂේප කිරීමට නිර්දේශ කරන ලද අයදුම්පත් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

ජාතිකත්වය	අයදුම්කරුවන්සංඛ්‍යාව	
	පිරිමි	ගැහැණු
චීන	-	4
කොළොම්බියානු	-	6
මැඩගස්කර	-	2
මැලේසියානු	-	1
නේපාල	-	1
පාකිස්ථානු	1	
උස්බෙකිස්ථානු	-	12
තායි	-	5
රුසියානු	-	1
යුක්‍රේන	-	1
ඉන්දුනීසියානු	-	2
අසර්බයිජාන	-	1
එකතුව	**1**	**36**
	37	

❖ විපරම් ලේඛනයට ඇතුළත් කරන ලද විදේශිකයන් 909 දෙනාගෙන් 37 දෙනෙකු සඳහා වීසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරනලදී.වීසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරනලද 37 දෙනාගෙන් 36 දෙනෙකු කාන්තාවන් වූ අතර බහුතරය උස්බෙකිස්ථාන ජාතික කාන්තාවන් වේ.

2.3 2023 වසරේ විමර්ශන අංශයේ ක්‍රියාවලීන් හරහා රටින් ඉවත් කළ / පිටුවහල් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

ජාතිය	ඉවත් කිරීමේ නියෝග නිකුත් කිරීම හා පිටුවහල් කිරීම	ඉවත් වීමට දැනුම් දීම	සමස්ථ ඉවත් කිරීම
ඉන්දියානු	228	114	342
මාලදිවයින්	5	1	6
පකිස්ථානු	11	-	11
බ්‍රිතාන්‍ය	1	-	1
ජර්මානු	1	-	1
චීන	17	9	26
තායිලන්ත	22	1	23
නේපාල	3	1	4
මැඩගස්කර්	2	3	5
ඉරාන	2	2	4
ඉරාක	5	-	5
නයිජීරියානු	3	-	3
බෙලරූස්	1	-	1
දකුණු කොරියානු	-	1	1
යුක්‍රේන	-	1	1
ඇමරිකානු	-	2	2
රුසියානු	5	2	7
ඊශ්‍රායල	-	1	1
ටර්ක්මෙනිස්ථානය	-	1	1
බංගලාදේශ	1	1	2
ප්‍රංශ	1	1	2
රුමේනියානු		1	1
බෙල්ජියානු	1	-	1
අයිවරි	1	-	1
පලස්තීන	2	-	2
එක්සත් අරාබි එමීර්	1		1
මුළු එකතුව	**313**	**142**	**455**

- 2023 වර්ෂයට අදාළව, විමර්ශනයට ලක්වූ විදේශිකයන්ගෙන් ආගමන හා විගමන පනත උල්ලංඝණය කළ විදේශිකයන් 455 දෙනෙකු ඉවත් කිරීමේ නියෝග හා පිටුවහල් කිරීමේ නියෝග මත, සහ ඉවත් වීමේ දැනුම් දීම් මත,මෙරටින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

- ඒ අනුව, විමර්ශන කටයුතු හරහා විදේශිකයන් මෙරටින් ඉවත් කිරීමට හෝ පිටුවහල් කිරීමට හේතු සාධක කිහිපයක් බලපානු ලැබේ.

විදේශිකයන් රටින් ඉවත් කිරීමට / පිටුවහල් කිරීමට හේතු :

1. වීසා කාලය ඉක්මවා රැඳී සිටීම
II. වීසා කොන්දේසි උල්ලංඝණය කිරීම (උදා: සංචාරක වීසාවක් දරමින් රැකියාවක හෝ සමාජ විරෝධි ක්‍රියාවන්හි නිරත වීම)
III. අධිකරණ නියෝග

2.4 2023 වර්ෂයට අදාළව විමර්ශන අංශය මඟින් වීසා නියමාණුකූල බවට පත් කළ විදේශිකයන් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

ජාතිය	වීසා නියමාණුකූල බවට පමුණුවීම්
ඉන්දියානු	10
මාලදිවයින්	1
ප්‍රංශ	1
තායිලන්ත	3
චීන	8
යුක්‍රේන	5
මුළු එකතුව	**28**

- විමර්ශන අංශයේ නියෝග පරිදි විදේශීය ජාතිකයන් 28 දෙනෙකු 2023 වර්ෂය තුළ අදාළ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, වීසා නියමාණුකූල බවට පත් කරගන්නා ලදී.

2.5 විමර්ශන අංශය විසින් වාර්ෂිකව සිදුකළ සමස්ථ විමර්ශන සංඛ්‍යාව (2018 – 2023)

- ක්ෂේත්‍ර ආවේක්ෂණ සහ දුරස්ථ ආවේක්ෂණය යන දෙයාකාරය ඔස්සේ විමර්ශන අංශය විසින් 2018 සිට 2023 වර්ෂය දක්වා සිදු කරන ලද සමස්ථ විමර්ශන සංඛ්‍යාව පහතින් දැක්වේ.

මාසය	2018	2019	2020	2021	2022	2023
ජනවාරි	99	210	172	50	243	488
පෙබරවාරි	124	190	85	38	526	214
මාර්තු	166	337	49	191	95	215
අප්‍රේල්	126	209	3	19	69	131
මැයි	49	236	49	18	49	76
ජූනි	119	162	58	4	60	139
ජූලි	157	131	24	16	41	195
අගෝස්තු	72	90	47	2	66	175
සැප්තැම්බර්	113	140	39	12	61	129
ඔක්තෝබර්	233	63	10	16	177	80
නොවැම්බර්	316	116	2	45	96	69
දෙසැම්බර්	192	81	18	94	158	42
එකතුව	**1,766**	**1,965**	**556**	**505**	**1,641**	**1,953**

2.6 විමර්ශන අංශය විසින් වාර්ෂිකව මෙරටින් ඉවත් කළ / පිටුවහල් කළ සමස්ථ විදේශීකයන් සංඛ්‍යාව (2018 – 2023)



විමර්ශන කටයුතු මෙහෙය වීමෙන් අනතුරුව, මෙරටින් ඉවත් වීමට නියෝග කළ හෝ රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා තබා, මෙරටින් ඉවත් කරන ලද හෝ පිටුවහල් කරන ලද සමස්ථ විදේශීකයන් සංඛ්‍යාව 2018 සිට 2023 වර්ෂය දක්වා පහතින් දක්වා ඇත.

වසර	මෙරටින් ඉවත් කළ / පිටුවහල් කළ සමස්ථ සංඛ්‍යාව
2018	678
2019	898
2020	249
2021	130
2022	501
2023	455
එකතුව	**2,911**

2.7 2023.12.31 දිනට ඉහත රඳවා තැබීමේ මධ්‍යස්ථානවල රඳවා සිටි රැඳවියන් ගණන

රඳවා තැබීමේ මධ්‍යස්ථානය	ගැහැණු	පිරිමි
මිරිහාන	-	166
වැලිසර	33	146
එකතුව	**33**	**312**

2.8 2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂයේ රඳවා තැබීමේ මධ්‍යස්ථානවලට ඇතුළත් කළ සහ ඉවත් කළ රැඳවියන් සංඛ්‍යාව (ජාතිකත්වය අනුව)

ජාතිකත්වය	ඇතුළත් කළ ගණන	ඉවත් කළ ගණන
බංගලාදේශ	6	1
චීන	18	17
ජර්මන්	1	1
ඉන්දියන්	44	39
ඉන්දීය ධීවරයන්	210	189
ඉරාන	2	2
ඉරාක	5	5
මාලදිවයින්	2	5
නේපාල්	4	3
නයිජීරියානු	6	3
පකිස්ථානු	6	11
රෝහින්ග්‍යා	2	-
ඇමරිකානු	1	-
බහමියානු	1	-
බෙලරූස්	1	1
බ්‍රිතාන්‍ය	1	1
ඊජිප්තු	1	-
ප්‍රංශ	1	1
මැඩගස්කර්	1	2
පලස්තීන	2	2
එක්සත් ආරාබි එමීර්	1	1
රුසියානු	7	5
තායිලන්ත	22	22
බෙල්ජියම්	-	1
අයිවරි	-	1
එකතුව	**345**	**313**

- රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා සිටි රෝගීන් හා සරණාගතයින් 103 දෙනෙකු මෙම වසරේ දී නිදහස් කරන ලදී.

2.9 තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානයේ සහය ඇතිව 2023 වර්ෂය තුළ සංවිධානය කළ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන්

අනු අංකය	වැඩසටහනේ නම/දිනය/මාසය	සහභාගී වූ නිලධාරීන් ප්‍රමාණය	පැවැත් වූ කාල සීමාව
01	ගුවන් තොටුපලේ දී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 10	දින 05
02	දේශ සීමා පාලන කළමනාකරණය	ආගමන හා විගමන නිලධාරීන් 24	දින 01
03	විවෘත මූලාශ්‍ර මඟින් බුද්ධි තොරතුරු ලබා ගැනීම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 20	දින 02
04	විමර්ශන සංවිධානය සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 20	දින 03
05	නීති විරෝධී සංක්‍රමණයට එරෙහි විමර්ශනයට අදාල තාක්ෂණික ක්‍රම	ආගමන හා විගමන නිලධාරීන් 05	දින 01
06	ගුවන් තොටුපල අපරාධ විමර්ශන මූලික පාඨමාලාව	ආගමන හා විගමන නිලධාරීන් 05	දින 05
07	කැනේඩියානු ගමන් ලේඛන විභාග කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 60	දින 02

2.10 එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහකොමසාරිස් කාර්යාලයේ (UNHCR) ලියාපදිංචි වීම පිළිබඳ දත්ත

- **2023.**12.31 දින වන විට සරණාගත තත්ත්වය ඉල්ලුම්කර සිටි විදේශිකයන් සංඛ්‍යාව (Asylum Seekers) සහ සරණාගත තත්ත්වය ලබා ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින විදේශිකයන් සංඛ්‍යාව (Refugees)

ජාතිකත්වය	සරණාගත තත්ත්වය ඉල්ලුම්කර සිටින විදේශිකයන් සංඛ්‍යාව(Asylum Seekers)	සරණාගත තත්ත්වය ලබා මෙරට රැඳී සිටි විදේශිකයන් සංඛ්‍යාව (Refugees)
බංගලාදේශ	06	-
බෙලරුස්	03	-
ඊජිප්තු	01	-
ඉරාන	02	03
ඉරාක	04	01
මාලදිවයින්	01	02
මියන්මාර්	01	111
නයිජීරියානු	02	02
පකිස්ථානු	162	190
පලස්තීනු	01	04
ඇෆ්ගනිස්ථාන	-	53
සුඩාන	-	04
සිරියානු	-	02
යේමානු	-	08
එකතුව	**183**	**380**

2.11 වාර්ෂිකව සරණාගත තත්ත්වය සඳහා ඉල්ලුම් කළ සහ සරණාගත තත්ත්වය ලබා මෙරට රැඳී සිටි සමස්ථ සංඛ්‍යාව (2014 - **2023)**

වර්ෂය	සරණාගත තත්ත්වය ඉල්ලුම් කර සිටි සංඛ්‍යාව	සරණාග තතත්ත්වය ලබා සිටි සංඛ්‍යාව
2014	943	512
2015	608	784
2016	576	604
2017	628	822
2018	742	800
2019	361	1,045
2020	228	1,011
2021	208	912
2022	219	512
2023	183	380
එකතුව	**4,696**	**7,382**



2.12 අවදානම් තක්සේරු මධ්‍යස්ථානය මඟින් 2023 වර්ෂයට අදාළ වීසා අයදුම් කිරීම්වල අවදානම් තක්සේරුකරණය

ජාතිකත්වය	ඉල්ලුම් කළ මුළු ගණන	පරීක්ෂා කරන ලද සංඛ්‍යාව (RAC HITS)	ප්‍රතික්ෂේප කරන ලද සංඛ්‍යාව (RAC REJECTED)
පාකිස්ථාන	30,371	8,777	57
නේපාල	7,132	2,770	1
ඇෆ්ගනිස්ථාන	608	608	5
යේමන	596	360	2
මැඩගස්කර්	87	20	-
කොළොම්බියා	548	126	-
එකතුව	**39,342**	**12,661**	**65**

- 2023 වර්ෂයට තුළ දී මෙම ඒකකය විසින් දේශසීමා ආවේක්ෂණ ඒකකය (BSU) සහ ප්‍රත්‍යන්ත අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (BRAC) වෙත අවදානම් සහගත විදේශිකයන් 153 දෙනෙකු පිළිබඳ තොරතුරු ලබා දී ඇත.





2. 13 අවදානම් තක්සේරුකරණයේ වාර්ෂික ප්‍රගතිය (2019 - 2023)

වර්ෂය	ඉල්ලුම් කළ අයදුම්පත් සංඛ්‍යාව	පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව (RAC HITS)	ප්‍රතික්ෂේප කළ අයදුම්පත් සංඛ්‍යාව (RAC RE-
2019	6,440	523	58
2020	6,655	572	445
2021	12,472	4,807	281
2022	19,049	6,283	401
2023	39,342	12,661	65
එකතුව	**83,958**	**24,846**	**1,250**

2.14 2023 වර්ෂයේ දී දේශසීමා ආවේක්ෂණ ඒකකය හරහා අධීක්ෂණයට ලක් වූ සංඛ්‍යාව

දත්ත පද්ධතිය	සංඛ්‍යාව
ක්‍රියාකාරකම් වාර්තා	188
අක්‍රමවත් සංක්‍රමණයන්	415
මඟීන් සහ ලේඛන යොමු කිරීම්	1,860
පිටුවහල් කිරීම් සහ ප්‍රතික්ෂේප කිරීම්	3,830
එකතුව	**6,323**

2.15 2023 වර්ෂයට අදාළව දේශසීමා ආවේක්ෂණ ඒකකය හරහා ව්‍යාජ වීසා භාවිතයන් හඳුනා ගැනීම (ජාතිකත්වය අනුව)

ජාතිකත්වය	සංඛ්‍යාව
ඉතාලි	42
කැනඩා	15
ශ්‍රී ලාංකික	13
ප්‍රංශ	9
බ්‍රිතාන්‍ය	7
පෝලන්ත	6
ජපන්	5
රුමේනියා	4
ඕස්ට්‍රේලියා	3
ඔස්ට්‍රියා	3
ග්‍රීක	3
මැලේසියා	3
නෙදර්ලන්ත	2
ඉන්දියා	2
ජර්මන්	1
පෘතුගාල	1
ස්පාඤ්ඤ	1
ස්විස්ටර්ලන්ත	1
තායිලන්ත	1
එකතුව	**122**

2.16 2023 වර්ෂයට අදාළව දේශ සීමා ආවේක්ෂණ ඒකකය හරහා ව්‍යාජ ගමන් බලපත්‍ර භාවිතයන් හඳුනාගැනීම (ජාතිකත්වය අනුව)

ජාතිකත්වය	සංඛ්‍යාව
ශ්‍රී ලාංකික	28
කැනඩා	7
ජර්මන්	5
මැලේසියා	4
චීන	4
බ්‍රිතාන්‍ය	3
තායිවාන	2
ස්විස්ටර්ලන්ත	2
එක්සත් ආරාබි ඒමීර්	2
පොදු රාජ්‍ය මණ්ඩලීය	1
ගිනියා	1
මෙක්සිකෝ	1
ඇමරිකා	1
ගයනාව	1
ඔස්ට්‍රියා	1
බංගලාදේශ	1
බෲනායි	1
එකතුව	**65**

- 2023 වර්ෂයට අදාළව දේශසීමා ආවේක්ෂණ ඒකකය විසින් හඳුනාගත් ව්‍යාජ ලේඛන භාවිත කළ 187 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වැඩිදුර විමර්ශන කටයුතු සඳහා භාරදෙන ලදී.

ශ්‍රී ලංකාවේ දැනට පවතින දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය හමුවේ ශ්‍රී ලාංකිකයන් වැඩි ප්‍රමාණයක් විදේශගත වීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව, රන් ත්‍රිකෝණයට අයත් රටවල් හරහා යුරෝපය, උතුරු ඇමරිකාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවලට සිදු වන අවිධිමත් සංක්‍රමණයන් සහ මිනිස් ජාවාරම් මෙන්ම මිනිස් වෙළඳාම ද ඉහළ ගොස් ඇති ප්‍රවණතාවයක, එවැනි නීති විරෝධී ක්‍රියාවන් වළක්වාලීමට දේශ සීමා ආවේක්ෂණ ඒකකය විශාල කාර්ය භාරයක් ඉටු කරයි.

2.1.5 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

2.1.5.1 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2019– 2023

පනත	2019	2020	2021	2022	2023
1949 අංක 03	18	24	29	148	297
1967 අංක 14	13	16	25	158	294
1988 අංක 39	10	09	14	52	182
2003 අංක 35	-	01	-	15	07
2008 අංක 38	-	-	-	02	01



2.1.5.2 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

2023 වර්ෂයේ ක්‍රියාත්මකවූ මූලික මූලධන ව්‍යාපෘතින්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

-	ව්‍යාපෘතිය	ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
1	වව්නියාව විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම	0.4	0.38	95%	100%
2	මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම	1.79	1.79	100%	100%
3	මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර භාරදීමේ ක්‍රමවේදය සඳහා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම	1.1	1.02	93%	100%
4	ප්‍රසම්පාදන අංශය පුළුල් කිරීම	0.05	0.04	80%	100%
5	වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය නව ගොඩනැගිල්ලකට ගෙන යාම	11.16	11.13	100%	100%
6	යන්ත්‍රෝපකරණ හා උපකරණ වැඩිදියුණු කිරීම	1	0.4	40%	100%
7	වාහන නඩත්තු කිරීම	12	11.92	99%	99%
8	කාර්යාලයේ අවශ්‍යතා අනුව කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම	2.6	2.6	100%	100%
9	මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර භාරදීමේ ක්‍රමවේදය සඳහා කාර්යාල මේස මිලදී ගැනීම	4.5	4.41	98%	100%
10	යෙදවුම් සර්වරයක් මිලදී ගැනීම	220	219.72	100%	100%
11	මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර භාරදීමේ ක්‍රමවේදය සඳහා වෙබ් කැමරා මිලදීගැනීම	3.75	3.12	83%	100%
12	LCD තිර හා අමතර උපාංග මිලදී ගැනීම	4.3	4.26	99%	100%
13	පරිගණක යන්ත්‍ර 100ක් මිලදී ගැනීම	24.2	24.2	100%	100%
14	Barcode Scanner යන්ත්‍ර 30ක් මිලදී ගැනීම	1.2	1.12	93%	100%
15	මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර භාරදීමේ ක්‍රමවේදය සඳහා කැමරා මිලදී ගැනීම	3.6	3.56	99%	100%
16	මාර්ගගත ක්‍රමය ඔස්සේ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර භාරදීමේ ක්‍රමවේදය සඳහා ජෛව මිතික පරිලෝකන යන්ත්‍ර 7ක් මිල දී ගැනීම	3.5	3.47	99%	100%
17	ලැප්ටොල් 50ක් මිලදී ගැනීම	26	0	0%	45%
18	ගමන් බලපත්‍ර පරිලෝකන යන්ත්‍ර 20ක් මිලදී ගැනීම	20	16.6	83%	100%
19	ඇඟිලි සලකුණු පරිලෝකන යන්ත්‍ර 10ක් මිලදී ගැනීම	5	3.8	76%	100%
20	කාර්යාලයේ අවශ්‍යතා අනුව යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම	48.45	17.37	36%	100%
21	වව්නියාව ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ වැසිකිලියක් ඉදි කිරීම	2	2	100%	100%
22	පද්ධති යාවත්කාලීන කිරීම සඳහා ඉල්ලීම්	12	6.16	51%	100%
23	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු හුවමාරු කිරීම සඳහා වේදිකාවක් හඳුන්වාදීම	22	21.19	96%	100%

-	ව්‍යාපෘතිය	ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
24	ප්‍රතිපත්ති අංශය සඳහා ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම	27	15.09	56%	100%
25	ඉලෙක්ට්‍රොනික පැමිණීමේ හා පිටවීමේ කාඩ්පතක් හඳුන්වාදීම	2	1.89	95%	100%
26	ICAO ඡායාරූප මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීම	3	2.88	96%	100%
27	පරිශීලකයන් කළමනාකරණය කිරීමේ මොඩියුලය	10	9.83	98%	100%
28	මානව සම්පත් කළමනාකරණය කිරීමේ මොඩියුලය	17.5	16.2	93%	100%
29	සේවක පුහුණුව	6	5.99	100%	100%
30	හිස්ගමන් බලපත්‍ර මිලදී ගැනීම හා ඉලෙක්ට්‍රොනික ගමන් බලපත්‍රයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය	2,340	2,222.51	95%	100%
31	ගමන් බලපත්‍ර මුද්දර	18	11.47	64%	100%
32	විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය	52	49.74	96%	100%

2.1.5.3 නීති අංශය

I. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළ ඉල්ලීම් සඳහා එම පනතට අනුව තොරතුරු යොමු කිරීම.

II. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ අභියාචනා සඳහා එම පනතට අනුව පිළිතුරු යොමු කිරීම.

විශේෂ රාජකාරි ඉටුකිරීම

- නව ආගාමික හා විගාමික පනත කෙටුම්පත් කිරීමේ කාර්යය සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- වීසා ක්‍රමවේදය හා ගාස්තු සරල කිරීමේ ක්‍රමවේදයට අදාළ රෙගුලාසි සකස් කිරීම.

- මාර්ගගත ක්‍රමය ඔස්සේ නිකුත් කරනු ලබන විදේශ ගමන් බලපත්‍ර බෙදා හැරීම සම්බන්ධව තැපැල් දෙපාර්තමේන්තුව සමඟ මෙම දෙපාර්තමේන්තුව එළඹි ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

අනු අංක	ලිපිගොනුව සම්බන්ධ විස්තරය	2023 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා සමාලෝචනය
01	ආගමන හා විගමන පාලක ජනරාල් වෙනුවෙන් සාක්ෂි දීම සඳහා නියෝජිතයෙකු යවනු ලැබූ නඩු වාරයන්	නඩු වාරයන් ගණන 254
02	නීති අංශය වෙත දෛනික තැපැල මඟින් ලැබෙන අධිකරණ නියෝගයන් සඳහා වාර්තා ලබාදීම	වාර්තා ගණන 3628
විශේෂිත කාර්ය සාධන දර්ශක		අපේෂිත නිමවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමවුම		
		90%-100%	75%-89%	50%-74%
21.	පද්ධති යාවත්කාලීන කිරීම සඳහා ඉල්ලීම්	√		
22.	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු හුවමාරු කිරීම සඳහා වේදිකාවක් හඳුන්වාදීම	√		
23.	ප්‍රතිපත්ති අංශය සඳහා ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම	√		
24.	ඉලෙක්ට්‍රොනික පැමිණීමේ හා පිටවීමේ කාඩ්පතක් හඳුන්වාදීම	√		
25	ICAO ඡායාරූප මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීම	√		
26.	පරිශීලකයන් කළමනාකරණය කිරීමේ මොඩියුලය	√		
27.	මානවසම්පත් කළමනාකරණය කිරීමේ මොඩියුලය	√		
28.	සේවක පුහුණුව	√		
29	හිස්ගමන් බලපත්‍ර මිලදී ගැනීම හා ඉලෙක්ට්‍රොනික ගමන් බලපත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය	√		
30.	ගමන්බලපත්‍ර මුද්දර	√		
31.	විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය	√		

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනිමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 16 සාමය, යුක්තිය, ශක්තිමත් ආයතනය	ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට අදාළ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතන හා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම. මිනිස් ජාවාරම් හා තැනැත්තන් වෙළඳාම වැළැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම වගවීමෙන් හා විනිවිදභාවයෙන් යුතුව ජනතාව වෙත ගුණාත්මක හා කාර්යක්ෂයම සේවයක් ඉටු කිරීම	* ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශීකයන් පිළිබඳ සිදු කළ විමර්ශනයන් පාදක කොටගෙන රටෙන් ඉවත් කරන ලද විදේශීකයන් සංඛ්‍යාව * ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් පුද්ගලයින් සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයන් පදනම් කරගෙන රටට ඇතුළු වීම වැළැක්වූ විදේශීකයන් සංඛ්‍යාව * තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශන පාදක කොටගෙන හඳුනාගන්නා ලද සංඛ්‍යාව			

5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනිමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී ආයතනය ලත් ජයග්‍රහණ (දර්ශක ඇසුරින් විස්තර කරන්න)

I. ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශීකයන් පිළිබඳ සිදු කළ විමර්ශනයන් පාදක කොටගෙන රටෙන් ඉවත් කරන ලද විදේශීකයන් සංඛ්‍යාව

I.I 2023 වසරේ රට තුළ පැවති ඉන්ධන අර්බුදය හා පැවති වාතාවරණය හේතුවෙන් ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ විමර්ශන කටයුතු සිදු කිරීම් සීමා කිරීමට සිදු විය. නමුත්, දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය ඇසුරින් දුරස්ථ ආවේක්ෂණය හරහා ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින හා ලංකාවට පැමිණෙන විදේශිකයින්ගේ නිවැරදි තොරතුරු රැස්කිරීම, තොරතුරුවල නිවැරදිබව තහවුරු කිරීම හරහා විමර්ශන ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කිරීම. මෙම ක්‍රියාවලිය හරහා සැක සහිත විදේශීකයන්ගේ තොරතුරු විපරම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

1.2 2023 වසරේදී ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ සිදුකළ සමස්ථ විමර්ශනයන් සංඛ්‍යාව 785ක් වූ අතර දුරස්ථ ආවේක්ෂණය යටතේ, විදේශීකයන් 909 දෙනෙකුගේ තොරතුරු විසා අංශය හරහා විපරම් ලේඛනයට ඇතුළත් කරන ලද අතර, විසා දිගු ලබාගැනීමේදී විමර්ශන අංශය සඳහා අදාළ විදේශිකයා යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී.විපරම් ලේඛනයට ඇතුළත් කරන ලද විදේශීකයන් 909 දෙනාගෙන් 37 දෙනෙකු

සඳහා විසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරනලදී.විසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරන ලද 37 දෙනාගෙන් 36 දෙනෙකු කාන්තාවන් වූ අතර බහුතරය උස්බෙකිස්ථාන ජාතික කාන්තාවන් වේ.

1.3 2023 වර්ෂයට අදාළව ක්ෂේත්‍ර ආවේක්ෂණ තුළින් විමර්ශනයන්ට ලක් කළ සහ දුරස්ථ ආවේක්ෂණය තුළින් විපරම් ලේඛනයට ඇතුළත් කළ සමස්ථ විදේශිකයන් සංඛ්‍යාව 1953 වන අතර, ඒ අතරින් එම වර්ෂයට අදාළව විදේශිකයන් 419 දෙනෙකු සඳහා වැඩිදුර විමර්ශන කටයුතු මෙහෙයවා ඇත.

1.4 2023 වර්ෂයට අදාළව රඳවා තැබීමේ මධ්‍යස්ථානවලට විදේශිකයන් 345 ඇතුළත් කර ඇති අතර, අදාළ වසර තුළ ඉවත් කිරීමේ නියෝග හා පිටුවහල් කිරීම් මත විදේශිකයන් 313ක් මෙරටින් ඉවත් කර ඇත. දුරස්ථ හා ක්ෂේත්‍ර ආවේක්ෂණය හරහා සිදු කරන ලද විමර්ශනයන්ගෙන් පසු විදේශිකයන් 142 දෙදෙනෙකුට මෙරටින් ඉවත් වීමට දැනුම් දෙන ලදි. ඒ අනුව, 2023 වර්ෂයට අදාළව, විමර්ශනයට ලක්වූ විදේශිකයන්ගෙන් ආගමන හා විගමන පනත උල්ලංඝණය කළ විදේශිකයන් 455 දෙනෙකු මෙරටින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

1.5 විමර්ශන අංශයේ නියෝග පරිදි විදේශීය ජාතිකයන් 28 දෙනෙකු 2023 වර්ෂය තුළ අදාළ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, වීසා නියමානුකූල බවට පත් කරගන්නා ලදී.

2. ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් පුද්ගලයින් සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයන් පදනම් කරගෙන රටට ඇතුළු වීම වැළැක් වූ විදේශිකයන් සංඛ්‍යා

2.1 2023 වර්ෂයේ වීසා සඳහා අයදුම් කළ විදේශිකයන්ගෙන් 39342ක් වූ අයදුම්කරුවන් අතරින් අවදානම්සහගත විදේශිකයන් 12661 සංඛ්‍යාවක් පරීක්ෂා කළ අතර, එම අයදුම්පත් අතරින් විදේශිකයන් 65ක් අවදානම් තක්සේරුකරණය හරහා ප්‍රතික්ෂේප කරනු ලැබීය. ඉන් වැඩි පිරිසක් පාකිස්ථාන ජාතිකයන් විය.

2.2 2023 වර්ෂයට අදාළව දේශසීමා ආවේක්ෂණ ඒකකය විසින් හඳුනාගත් ව්‍යාජ ලේඛන භාවිත කළ විදේශිකයන් 187 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වැඩිදුර විමර්ශන කටයුතු සඳහා භාරදෙන ලදී.

3. තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් සිදුකළ විමර්ශන පාදක කොට ගෙන හඳුනාගන්නා ලද සංඛ්‍යාව

3.1 තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශන පාදක කොටගෙන 2023 වර්ෂය තුළ විදේශිකයන් 19 දෙනෙකු හඳුනාගන්නා ලදී.

4. ව්‍යාජ මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර භාවිත කරමින් ශ්‍රී ලාංකික දරුවන් මැලේසියාව හරහා යුරෝපයට රැගෙන යාමේ ජවාරම අනාවරණය කරගැනීම.

4.1 ව්‍යාජ මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර භාවිත කරමින් මැලේසියාව හරහා යුරෝපය වෙත ශ්‍රී ලාංකීක දරුවන් රැගෙන යාමේ ජවාරම, පසුගිය වසර තුළ විමර්ශන ශාඛාවට අදාළව අවදානම් තක්සේරු මධ්‍යස්ථානය විසින් අනාවරණය කරගත් විශේෂ විමර්ශනයක් විය. ඒ අනුව, පසුගිය වසරේ දී වයස අවුරුදු 5 ත් 17 ත් අතර ළමුන් 17 දෙනෙකු පමණ සිය දෙමව්පිය කැමැත්ත මත මෙරටින් මැලේසියාවට සංක්‍රමණය වී ඇති අතර ඔවුන් නැවත මෙරටට පැමිණ නොමැත. ප්‍රත්‍යාන්ත දත්ත පද්ධතිය දීර්ඝ ලෙස

විශ්ලේෂණය කිරීමෙන්, සැකකරුවන්ගේ සංචාරක දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් සහ ස්ථානීය පරීක්ෂණ හරහා තොරතුරු රැස් කරගනිමින් මෙම ජාවාරමට සම්බන්ධ සැකසහිත පුද්ගලයින් හඳුනාගැනීමට විමර්ශන ශාඛාවට හැකි වී ඇත.

4.2 නීත්‍යානුකූල සංචාරක වීසා මත සංක්‍රමණය වන ශ්‍රී ලාංකික දරුවන් වැළැක්වීම දුෂ්කර වුවත්, මෙම මිනිස් ජාවාරම පිළිබඳ මැලේසියානු නියෝජිත පිරිස සමඟ බුද්ධිමය සහ කාලීන තොරතුරු එලදායීව හුවමාරු කරගැනීම හරහා මැලේසියානු දේශසීමා නිලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන ළමුන්ගේ සැකසහිත සංක්‍රමණයන් හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට කටයුතු කරනු ඇත.

4.3 ඒ අනුව, මෙම ශ්‍රී ලාංකික දරුවන් සම්බන්ධ මිනිස් ජවාරම පිළිබඳ විමර්ශන ශාඛාව විසින් සොයා ගන්නා ලද සියලු තොරතුරු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ශ්‍රී ලංකා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. මෙරට ක්‍රියාත්මක දැවැන්ත මිනිස් ජාවාරමක් අනාවරණය කරගැනීම මඟින් එය වළක්වා ගැනීමට අඩිතාලම දැමීමට හැකි වීම, 2023 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව ලද විශේෂ ජයග්‍රහණයක් විය.

5. ශ්‍රී ලංකාව හා මැලේසියාව අතර ද්විපාර්ශ්වීය ඒකාබද්ධ මෙහෙයුම

- මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) විසින් ශ්‍රී ලංකාවේ හා මැලේසියාවේ ආගමන විගමන නිලධාරීන් සඳහා සංවිධානය කරනු ලැබූ ද්විපාර්ශ්වීය සාකච්ඡාව 2023 ජූලි මස 4 සහ 5 යන දෙදින තුළ ශ්‍රී ලංකාවේ ටාජ් සමුද්‍ර හෝටල් පරිශ්‍රයේදී පැවැත්වුණි.

- මිනිස් ජවාරම් සහ සංක්‍රමණික ගැටලු, සංක්‍රමණික ප්‍රවණතා සහ රටාවන් පිළිබඳ තොරතුරු, අභියෝග, භාවිතයන් සහ අත්දැකීම් හුවමාරු කරගැනීම හරහා මෙහෙයුම් සහයෝගිතාව වැඩිදියුණු කරගැනීම මෙහි අරමුණ විය. මේ හරහා විශේෂයෙන්, ශ්‍රී ලාංකිකයන් විසින් මැලේසියාවේ සංචාරක වීසා අවභාවිත කිරීම සහ බලහත්කාරයෙන් මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර භාවිත කිරීම පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම ආරම්භ කළ අතර, ඉහත සඳහන් ශ්‍රී ලාංකික දරුවන් සම්බන්ධ මිනිස් ජාවාරම පිළිබඳව ද ද්විපාර්ශ්වීය සාකච්ඡාවට ලක් විය.

6. බාලි ක්‍රියාවලියට අදාළ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලසුම් කිරීමේ සැසිවාරය 2023-2024
(Bali Process—Joint Period of Action 2023-2024 – Planning Session)

6.1 මිනිස් ජාවාරම් සහ තැනැත්තන් වෙළඳාම යටතේ යුරෝපයට, උතුරු ඇමරිකාවට සහ ඕස්ට්‍රේලියාවට නීති විරෝධී ලෙස ඇතුල්වීමේ අරමුණින් තායිලන්තය, මියන්මාරය සහ වියට්නාමය යන රටවලට නීත්‍යානුකූලව ඇතුල්වීම සහ පිටවීම සම්බන්ධ අපරාධ ජාලයන් කඩාකප්පල් කිරීමට අදාළව, 2023 ජූලි මස 26, 27 යන දිනයන්හි දී තායිලන්තයේ පැවති සැසිවාරය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහභාගි වූ අතර, මෙහිදී රන් ත්‍රිකෝණයට අදාළ ශ්‍රී ලංකා දේශසීමා පාලන අභියෝග සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

6.2 මෙම සැසිවාරයට අදාළව 2023 ඔක්තෝබර් මස 18, 19 යන දිනයන්හි දී බැංකොක් නුවර පැවති රැස්වීම් වාර සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහභාගි වෙමින්, අග්නිදිග ආසියානු කලාපයේ සිදුවන අවිධිමත් ශ්‍රී ලාංකීක සංක්‍රමණයන් පිළිබඳ තොරතුරු හුවමාරු කරගන්නා ලදී.

7. 2023 වර්ෂයේ දී විමර්ශන අංශය විසින් සිදු කළ විශේෂ පිටුවහල් කිරීම්

7.1 චීනජනරජයට අවශ්‍යාව සිටි, රතු නිවේදන නිකුත් කර තිබූ, මෙරට රැඳී සිටි චීන ජාතිකයෙකු විමර්ශන අංශයේ බලයලත් නිලධාරීන්ගේ හා විශේෂ කාර්යය බලකායේ නිලධාරින්ගේ ආරක්ෂාව යටතේ මෙරටින් පිටුවහල් කර, චීනයේ දී එරට ආගමන හා විගමන නිලධාරින්ට භාර දීම.

7.2 ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ ඉන්දීය රජයට අවශ්‍යාව සිටි, මෙරට රැඳී සිටි ඉන්දීය ජාතිකයෙකු විමර්ශන අංශයේ බලයලත් නිලධාරින්ගේ ආරක්ෂාව යටතේ මෙරටින් පිටුවහල් කර, ඉන්දියාවේ දී එරට ආගමන හා විගමන නිලධාරින්ට භාර දීම.

7.3 වලංගු වීසා නොමැතිව අත්අඩංගුවට පත්ව, මෙරටින් ඉවත් වීම ප්‍රතික්ෂේප කරමින් වසර හතරක් පමණ රැඳවුම් මධ්‍යස්ථානයේ රැඳී සිටි ඉන්දීය ජාතිකයන් දෙදෙනෙකු, මෙරට රජයේ වියදමින් විමර්ශන අංශයේ බලයලත් නිලධාරීන්ගේ ආරක්ෂාව යටතේ මෙරටින් පිටුවහල් කර, ඉන්දියාවේ දී එරට ආගමන හා විගමන නිලධාරීන්ට භාර දීම.

8. මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන

වර්තමානයේ විදේශගත වන බොහෝ පිරිස්තැනැත්තන්වෙළඳාමට, මිනිස් ජාවාරමට හා වෙනත් ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම්වල ගොදුරු බවට පත්ව ඇත.මෙයට ප්‍රධාන හේතුව නීති රීති හා අවිධිමත්ව විදේශගත වීම පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම බව පෙනී යයි.එබැවින් මහජනතාව දැනුවත් කිරීම රාජ්‍ය ආයතනයක් වන ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට යම්කිසි වගකීමක් පැවරී ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ තැනැත්තන් වෙළඳාමට එරෙහි ජාතික සන්ධානයේ පස් අවුරුදු සැලැස්ම අනුවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව සඳහන් කර ඇත.

ඉහත අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වසරේ දී අප විසින් විස්තර පත්‍රිකාවක් සකස් කරනු ලැබීය. ඒ සඳහා අනුග්‍රහය දැක්වීමට SAFE Foundation ආයතනය කැමැත්ත පළ කළ අතර, එම ආයතනය විසින් මෙම වැඩසටහන වැඩිදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා මහජනතාවගේ ආකර්ෂණය දිනාගත් සමාජ ජාල නිර්මාණකරුවන් කිහිප දෙනෙක් මෙම වැඩසටහනේ සන්නාම තානාපතිවරුන් වශයෙන් පත් කර ඇත.

මෙහි විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අවධානයට ලක්කළ කරුණු කිහිපයක්ද සඳහන් කර ඇත. මේ මගින් ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි අපහසුතාවයන්ට පත්වීම අවම කර ගැනීම හා නීත්‍යානුකූල විදේශගතවීම දිරිමත් කිරීම ප්‍රධාන අරමුණයි.

2023 වර්ෂයේ දී විමර්ශන අංශයේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක පුහුණු වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගී වූ නිලධාරීන් ප්‍රමාණය	පැවැත්වූ කාල සීමාව
ගුවන් තොටුපලේ දී පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 10	දින 05
දේශ සීමා පාලන කළමනාකරණය	ආගමන හා විගමන නිලධාරීන් 24	දින 01
විවෘත මූලාශ්‍ර මඟින් බුද්ධි තොරතුරු ලබා ගැනීම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 20	දින 02
විමර්ශන සංවිධානය සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රම පිළිබඳ වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 20	දින 03
නීති විරෝධී සංක්‍රමණයට එරෙහි විමර්ශනයට අදාළ තාක්ෂණික ක්‍රම	ආගමන හා විගමන නිලධාරීන් 05	දින 01
ගුවන් තොටුපල අපරාධ විමර්ශන මූලික පාඨමාලාව	ආගමන හා විගමන නිලධාරීන් 05	දින 05
කැනේඩියානු ගමන් ලේඛන විභාග කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 60	දින 02
සංක්‍රමණිකයන් ජාවාරම් වැළැක්වීම පිළිබඳ බාලි ක්‍රියාවලි කලාපීය පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 02	දින 04
තැනැත්තන් වෙළඳාම සහ සංක්‍රමණිකයන් ජාවාරම් පරීක්ෂණ සඳහා ඉලෙක්ට්‍රොනික සාක්ෂි හැසිරවීම	ආගමන හා විගමන නිලධාරීන් 02	දින 03
වින්දිතයින් හඳුනා ගැනීම වැඩි දියුණු කිරීම	ආගමන හා විගමන නිලධාරීන් 10	දින 04
ජාත්‍යන්තර සරණාගත ආරක්ෂාව	ආගමන හා විගමන නිලධාරීන් 30	දින 01
කැනේඩියානු ගමන් ලේඛන විභාග කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරීන් 40	දින 01
ජාත්‍යන්තර පුද්ගල ජාවාරම් සහ විමර්ශන	ආගමන හා විගමන නිලධාරීන් 02	දින 02
තැනැත්තන් වෙළඳාමට සහ මිනිසුන් ජාවාරමට එරෙහි වීම	ආගමන හා විගමන නිලධාරීන් 02	දින 02
තැනැත්තන් වෙළඳාමට සහ මිනිසුන් ජාවාරමට එරෙහි වීම පිළිබඳ පුහුණු වැඩමුළුව (ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සම්පත් දායකයන් මඟින්)	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී 01 (සම්පත් දායක)	දින 03
බාලි ක්‍රියාවලියේ දේශසීමා සංසදයේ ප්‍රාදේශීය ආධාරක කාර්යාලය මඟින් තොරතුරු බෙදාගැනීම සඳහා Alumni දිනය සැමරීම සඳහා සමුළුව	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී 01	දින 03
ස්විට්සර්ලන්ත ගමන් ලේඛන විභාග කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරී 81	දින 02
විවෘත මූලාශ්‍ර බුද්ධිය පිළිබඳ පුහුණු වැඩමුළුව	ආගමන හා විගමන නිලධාරී 15	දින 01
තැනැත්තන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සහ දිස්ත්‍රික්ක 12 ක ස්වේච්ඡා නීතිඥයින් සඳහා ආරක්ෂිත සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම (ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සම්පත් දායකයන් මඟින්)	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී 01 (සම්පත් දායක)	දින 01
TRIP උපාය මාර්ගය - ICAO ප්‍රමිතීන්	ආගමන හා විගමන නිලධාරී 15	දින 05
ආසියා පැසිෆික් කලාපයේ තැනැත්තන් වෙළඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම	ආගමන හා විගමන නිලධාරී 01	දින 04
බාලි ක්‍රියාවලි ඒකාබද්ධ මෙහෙයුම් සමුළුව 2023-2024	ආගමන හා විගමන නිලධාරී 02	දින 03

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

දෙපාර්තමේන්තුවේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීමට සහ ඉහළ කාර්යසාධන මට්ටමක් අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා පුහුණු හා සංවර්ධන ඒකකය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා සංවර්ධන ක්‍රියාවලිය විශාල දායකත්වයක් ලබා දේ.

ආයතනය වෙත වාර්ෂික ස්ථාන මාරු පදනමින් හෝ නව බඳවා ගැනීමේ ක්‍රමවේදයෙන් දෙපාර්තමේන්තුවට එක් වන නව කාර්ය මණ්ඩල සාමාජිකයන්ට දෙපාර්තමේන්තු කාර්යයන් පිළිබඳව ලබා දෙන විධිමත් පුහුණුව මෙන්ම නිලධාරියා දෙපාර්තමේන්තුවේ සේවය කරන කාලය තුළම ඔවුන්ට අවශ්‍ය වන දැනුම යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ පුහුණු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වේ.

අවශ්‍යතා අනුව යාවත්කාලීන වන විධිමත් පුහුණු සැලැස්මකට අනුව ක්‍රියාත්මක මෙම වැඩපිළිවෙළ මඟින් නව ගෝලීය ප්‍රවණතා සමඟ එයට අනුගත වෙමින් ඉදිරියට යන දෙපාර්තමේන්තුවක් ලෙස එහි නිලධාරීන් දැනුමෙන් පෝෂිත කිරීම කෙරෙහි නිරන්තර අවධානයෙන් කටයුතු කරනු ලැබේ.

පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා වර්ෂයකට වෙන්වන රාජ්‍ය ප්‍රතිපාදනයන්ට අමතරව ජාත්‍යන්තර සංවිධාන, තානාපති කාර්යාල දේශීය සංවිධාන හා පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතන අනුග්‍රහකත්වය යටතේද , විදේශීය පුහුණු අවස්ථාවන් හඳුනා ගනිමින් ඒ සඳහා නිලධාරීන්ට අවස්ථාව සලසාලමින්ද නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමට නිරන්තරව කටයුතු කරනු ලබයි. අනුග්‍රහකත්වය ලබා දෙන තානාපති කාර්යාල අතරින් ඇමරිකානු තානාපති කාර්යාලය, කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය ප්‍රධාන වේ.

2023 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් 53න් 32ක් දේශීය අරමුදල් මඟින්ද ,21 ක් ජාත්‍යන්තර සංවිධාන, තානාපති කාර්යාල වැනි බාහිර ආයතනයන්ගේ අනුග්‍රහකත්වය යටතේද පවත්වා ඇත.

දේශීය අරමුදල් යටතේ අයවැය මඟින් ලැබී තිබූ මිලියන 6 කිසිදු ඉතිරිවීමකින් තොරව පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා යෙදවීම සහ අනුග්‍රහකත්වය යටතේ විධායක නිලධාරීන් හා බලයලත් නිලධාරීන් සඳහා විශාල පිරිවැයකින් යුත් පුහුණු හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම මඟින් මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන මට්ටම ඉහළ නැංවීමට පුහුණු හා සංවර්ධන අංශය මනා දායකත්වයක් ලබා දී ඇති ආකාරය පිළිඹිබු වේ.
2023 වසර තුළ ක්‍රියාත්මක කළ පුහුණු හා සංවර්ධන වැඩසටහන් පහත වගුවෙන් සම්පිණ්ඩනය කර දක්වා ඇත.

- ක්‍රියාත්මක කළ පුහුණු හා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව - 53

නිලධාරී කාණ්ඩය	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	
	විශේෂිත	පොදු
විධායක නිලධාරීන්	4	4
ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්	3	
බලයලත් නිලධාරීන්	28	
සංවර්ධන නිලධාරීන්	6	4
කළමණාකරණ සේවා නිලධාරීන්	4	4
ගමන් බලපත් සහයක නිලධාරීන්	3	
කාර්යාල කාර්ය සහායක		4
රියදුරු මහතුන්	1	4





පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා වියදම **226-01-1-2401 – (මිලියන 6)**

නිලධාරී කාණ්ඩය	රු. (000)
විධායක නිලධාරීන්	550
ජොෂ්ය බලයලත් නිලධාරීන් බලයලත් නිලධාරීන්	3,740
සංවර්ධන නිලධාරීන්	325
කළමණාකරණ සේවා නිලධාරීන්	850
ගමන් බලපත් සහයක නිලධාරීන්	38
කාර්යාල කාර්ය සහායක	87
රියදුරු මහතුන්	270
වෙනත්	140

මාසික පුහුණු වැඩසටහන් සාරාංශය -2023

නිලධාරී කාණ්ඩය	පුහුණු වැඩසටහන් පවත්වන ලද මාසය											
	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
විධායක නිලධාරීන්	✓	▪	▪	▪	▪	✓	✓	✓	✓	✓	✓	✓
ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්	▪	✓	▪	▪	▪	▪	▪	▪	▪	▪	✓	✓
බලයලත් නිලධාරීන්	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
සංවර්ධන නිලධාරීන්	✓	▪	✓	▪	✓	▪	✓	✓	▪	▪	✓	✓
කළමණාකරණ සේවා නිලධාරීන්	✓	▪	▪	▪	▪	▪	✓	✓	▪	▪	✓	✓
ගමන් බලපත් සහයක නිලධාරීන්	▪	▪	▪	✓	▪	▪	▪	▪	▪	▪	▪	▪
කාර්යාල කාර්ය සහායක	✓	▪	▪	▪	▪	▪	✓	✓	▪	▪	✓	✓
රියදුරු මහතුන්	✓	▪	▪	▪	▪	▪	✓	✓	▪	▪	▪	✓

6.3 මානව සම්පත් සංවර්ධනය - 2023 (පුහුණු හා සංවර්ධන ඒකකය)

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
01	සේවක අනුස්ථාපන වැඩසටහන (Orientation programme)	ජනවාරි 2 - 9	ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් - 70	දින 05	28	-	දේශීය	විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම.
02	මාලදිවයින හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සාකච්ඡා	ජනවාරි 13 - 15	බලයලත් නිලධාරී 01	දින 02	-	-	විදේශීය	මාලදිවයින හා ශ්‍රී ලංකාව අතර සංක්‍රමණික ජාවාරම් මැඩලීම සඳහා සන්නිවේදන මාර්ග ශක්තිමත් කිරීම, තොරතුරු හුවමාරු කිරීම සහ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම.
03	විධායක නිලධාරීන් සඳහා "ව්‍යාපෘති කළමනාකරණය " පිළිබඳ පුහුණු වැඩමුළුව	ජනවාරි 29	සියලුම පාලක වරුන්/ නියෝජ්‍ය පාලක වරුන් හා සහකාර පාලක වරුන් - 50	දින 01	75		දේශීය	2023 වර්ෂයේ දී ආයතනයේ ප්‍රගමනයට සඳහා අවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන එම ව්‍යාපෘති යෝජනා වඩාත් ඵලදායි ලෙස ඉදිරිපත් කිරීම.
04	ගමන් බලපත්‍ර පරීක්ෂණය පිළිබඳ උසස් පාඨමාලාව	පෙබරවාරි 13—17	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්/ බලයලත් නිලධාරීන් 10	දින 05	27		දේශීය/ විදේශීය	විදේශ ගමන් බලපත්‍ර හා ඇතුළුවීම සඳහා භාවිතා කරනු ලබන සියලුම සහයක ලියකියවිලිවල නිරවද්‍යතාවය තහවුරුකිරීම.
05	මාලදිවයින හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සාකච්ඡා	පෙබරවාරි 13-15	බලයලත් නිලධාරී 01	දින 03	-	-	එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ ආයතනය	මාලදිවයින හා ශ්‍රී ලංකාව අතර සංක්‍රමණික ජාවාරම් මැඩලීම සඳහා සන්නිවේදන මාර්ග ශක්තිමත් කිරීම, තොරතුරු හුවමාරු කිරීම සහ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
					දේශීය	විදේශීය		
06	බලයලත් නිලධාරින් සඳහා සේවා අනුස්ථාපන පුහුණු වැඩසටහන (Orientation Programme) හා කටුනායක බ.ජ.ගු හා කොළඹ වරාය නිරීක්ෂණ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව	පෙබරවාරි 21 -28	නවක බලයලත් නිලධාරින් - 50	දින 04	245		දේශීය	දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම. ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුළුවීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය හා රාජකාරී කටයුතු අවබෝධ කර ගැනීම.
07	නවක බලයලත් නිලධාරින් සඳහා සේවාරම්භක පුහුණු වැඩමුළුව (Induction Training)	මාර්තු 1-31	නවක බලයලත් නිලධාරින් - 50	දින 30	2484		දේශීය	දෙපාර්තමේන්තුවට අදළ රාජකාරි කටයුතු හඳුනා ගැනීම , රාජකාරීයේ දී පැමිණෙන අභියෝගයන්ට මුහුණ දෙන ආකාරය අවබෝධ කර ගැනීම හා මනා විනයකින් යුතුව රාජකාරි කටයුතු කිරීම
08	මිනිස් ජාවාරම් සහ පුද්ගල ජාවාරම් විමර්ශනය කිරීම පිළිබද පුහුණු වැඩසටහන	මාර්තු 13 - 24	බලයලත් නිලධාරින් 2	දින 14	-	-	විදේශීය (ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය)	මිනිස් ජාවාරම් හා පුද්ගල ජාවාරම් සම්බන්ධයෙන් විමර්ශණය කිරීම හා නඩු පැවරීම සම්බන්ධයෙන් අවබෝධය ලබා දීම.
09	සරණාගතයින් සඳහා අන්තර්ජාතික ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව	මාර්තු 16	බලයලත් නිලධාරින් 20	දින 01	-	-	එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහා කොමසාරිස් කාර්යාලය	සරණාගතයන් හා රක්ෂස්ථානවාසීන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහා කොමසාරිස් කාර්යාලයේ දේශීය හා ගෝලීය කාර්යයභාරය පිළිබඳ අවබෝධය ලබා දීම.
10	මගී අවධානම් තක්සේරු කිරීමේ පුහුණු වැඩසටහන	මාර්තු 20—21	බලයලත් නිලධාරින් 15	දින 02	-	-	විදේශීය (ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය)	පුද්ගල ජාවාරම්, මිනිස් හා මත් සහ අනෙකුත් වංචා ඇතුළු දේශසීමා ආරක්ෂාවන්ට අවදානම සහ තර්ජන ගණනාවක් ඇති කළ මඟීන් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
11	මිනිස් ජාවාරම් සහ පුද්ගල ජාවාරම් පිළිබඳ කැනේඩියානු විශ්ලේෂණය	මාර්තු 21 - 23	බලයලත් නිලධාරීන් 60	දින 03	27	-	දේශීය	ජාත්‍යන්තර මිනිස් වෙළඳාම හා පුද්ගල ජාවාරම් පිළිබඳ කැනේඩියානු විශ්ලේෂණය මඟින් අවබෝධයක් ලබා දීම.
12	අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර මිනිස් ජාවාරම් වැළැක්වීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන	මාර්තු 24	බලයලත් නිලධාරීන් / සන්නාම තානාපතිවරුන්	දින 01	-	-	දේශීය (අනුග්‍රාහකත්වය ලබා දී ඇත.)	අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර මිනිස් ජාවාරම් වැළැක්වීම හා එවැනි ජාවාරම් අවම කිරීම සඳහා නිලධාරීන් සූදානම් කිරීම.
13	ගමන් බලපත්‍ර අයදුම්පත් මාර්ගගත ක්‍රමයට ලබා ගැනීම සම්බන්ධ පුහුණු වැඩමුළුව	මාර්තු 28	සංවර්ධන නිලධාරීන් (පු.ලි.දේ)	දින 01	26	-	දේශීය	ගමන් බලපත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනිම මඟින් වඩාත් කාර්යක්ෂම සේවාවක් මහජනයාට ලබා දීම සඳහා, එම කාර්යයේ නියුතු නිලධාරීන්ට එම කාර්යය වඩාත් ඵලදායිව ඉටුකිරීම
14	ගමන් බලපත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාගැනීම හා ඇඟිලි සලකුණු ලබාගැනීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන	අප්‍රේල් 3 - 4	සංවර්ධන නිලධාරීන් (පු.ලි.දේ)	දින 02	73		දේශීය	ගමන් බලපත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීම මඟින් වඩාත් කාර්යක්ෂම සේවාවක් මහජනයාට ලබා දීම සඳහා, එම කාර්යයේ නියුතු නිලධාරීන්ට එම කාර්යය වඩාත් ඵලදායිව කිරීම
15	දෙමළ භාෂා පාඨමාලාව (මාර්ග ගත ක්‍රමයට)	අප්‍රේල් 8	බලයලත් නිලධාරීන් 100 (50/50)	පැය 200	370		දේශීය	රාජ්‍ය සේවා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව නිලධාරීන්ගේ භාෂා කුසලතාව ඉහළ නැංවීම හා මහජන සම්බන්ධතාවය වර්ධනය කිරීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
16	නවක බලයලත් නිලධාරීන් සඳහා සේවා අනුස්ථාපන පුහුණු වැඩසටහන	අප්‍රේල් 3 - 10	බලයලත් නිලධාරීන් 11	දින 04	17		දේශීය	දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම.
17	කාර්යාල ක්‍රමවේදය හා කාර්යාල / ආයතන සංග්‍රහය	අප්‍රේල් 19 - 21	ගමන් බලපත් නිලධාරීන්	දින 03	33		දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට උපකාරී වීම සඳහා.
18	රාජ්‍ය මුල්‍ය රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	අප්‍රේල් - 20	ගමන් බලපත් නිලධාරීන්	දින 01	5		දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට උපකාරී වීම සඳහා.
19	ගුවන් තොටුපලේ දී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම පිළිබඳ වැඩමුළුව	අප්‍රේල් 24—28	බලයලත් නිලධාරීන් 10	දින 05	-	-	විදේශීය	ගුවන් ගමන් තහනම් ක්‍රියාවලිය පිළිබඳ නවීන විමර්ශන ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම හා එම රාජකාරීවල අනුයුක්ත නිලධාරීන්ගේ ඒ සම්බන්ධ නීතිය බලාත්මක කිරීමේ හැකියාව වර්ධනය කිරීම.
20	ගමන් බලපත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාගැනීම හා ඇඟිලි සලකුණු ලබාගැනීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන	මැයි 25	සංවර්ධන නිලධාරීන් (පු.ලි.දේ)	දින 01	199	-	දේශීය	ගමන් බලපත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීම මගින් වඩාත් කාර්යක්ෂම සේවාවක් මහජනයාට ලබා දීම සඳහා, එම කාර්යයේ නියුතු නිලධාරීන්ට එම කාර්යය වඩාත් ඵලදායිව කිරීම
21	ප්‍රත්‍යාන්ත පාලන කළමනාකරණය (Border Control Management)	මැයි 29 - ජුනි 9	බලයලත් නිලධාරීන් 20	දින 10	10	-	විදේශීය (ඇමරිකානු තනාපති කාර්යාලය)	දේශසීමා වල තර්ජන හඳුනා ගැනීමට සහ එම තර්ජන වලට මුහුණ දීමට සැලසුම් සකස් කිරීමට අවශ්‍ය උපක්‍රම සහ කුසලතා පිළිබඳ අවබෝධයක් ලබාදීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
22	ඉංග්‍රීසි භාෂා පාඨමාලාව (British Council)	ජූනි 7—අගෝ 9	බලයලත් නිලධාරීන් / විධායක නිලධාරීන්	පැය 50	-	-	විදේශීය (ඔස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලය)	රාජකාරී අවශ්‍යතාවයන්ට අනුව ඉංග්‍රීසි භාෂාව පරිශීලනය කිරීමේ හැකියාව (ලිඛිත හා වාචික) වර්ධනය කිරීම.
23	විවෘත මූලාශ්‍ර මඟින් බුද්ධි තොරතුරු ලබා ගැනීම පිළිබඳ වැඩමුළුව	ජූනි 12—16	බලයලත් නිලධාරීන් 40 (20/20)	දින 05	-	-	විදේශීය (කැනේඩියානු මහා කොමසාරිස් කාර්යාලය)	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම.
24	නව ආගාමික හා විගාමික රෙගුලාසි යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන	ජූනි 16—18	විධායක නිලධාරීන්	දින 03	230	-	දේශීය	නව ආගාමික හා විගාමික රෙගුලාසි යාවත්කාලීන අදාළ කරුණු සාකච්ඡා කිරීම.
25	නීති විරෝධී සංක්‍රමණයට එරෙහි විමර්ශනය සඳහා තාක්ෂණික ක්‍රම	ජූනි 19—21	බලයලත් නිලධාරීන් 5	දින 03	-	-	ප්‍රංශ තානාපති කාර්යාලය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම.
26	මාලදිවයින හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික සාකච්ඡා	ජූලි 4—5	බලයලත් නිලධාරීන් 7	දින 02	-	-	එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ ආයතනය	සංක්‍රමණික ජාවාරම්වලට එරෙහිව කාලාපීය ක්‍රියාමර්ග හා සන්නිවේදනය ශක්තිමත් කිරීම.
27	බාහිර ක්ෂේත්‍රගත පුහුණුව (Outbound Training)	ජූලි 15 –16	රියදුරු මහතුන්	දින 02	267	-	දේශීය	නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතති පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම.
28	සේවක අනුස්ථාපන වැඩසටහන (Orientation Programme)	ජූලි 26 - 28	ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් - 70	දින 03	49	-	දේශීය	විවිධ ආයතන වලින් අනුයුක්තවන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
29	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව (Procument Procedures)	ජූලි 26—27	කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී - 02	දින 02	44	-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය හා අරමුණ, ප්‍රසම්පාදන සැලසුම් හැඳින්වීම, විවිධ ප්‍රසම්පාදන ක්‍රම හා වර්ග හඳුනාගැනීම හා අධිකාරි බලය, සීමාවන්, උචිත ප්‍රසම්පාදන ක්‍රම තෝරාගැනීම.
30	ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව (Field Visit) බ.ජ.ගු	අගෝස්තු 08	සියලුම නිලධාරීන්	දින 01	52	-	දේශීය	ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ඒ ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම.
31	ගුවන් තොටුපල අපරාධ විමර්ශන පිළිබඳ මූලික පාඨමාලාව	අගෝස්තු 14—18	බලයලත් නිලධාරීන් 5	දින 05	-	-	විදේශීය (ඔස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලය)	ආගමන හා විගමන නිලධාරීන්ගේ බුද්ධිය, විමර්ශන භාවිතයන් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම.
32	විනය ක්‍රියාපටිපාටිය	අගෝස්තු 18	කළමනාකරණ සේවා නිලධාරීන් 001	දින 01	12	-	දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම
33	රජයේ වාහන නඩත්තුව	අගෝස්තු 23	කළමනාකරණ සේවා නිලධාරීන් 02	දින 01	10	-	දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම
34	සේවක අනුස්ථාපන වැඩසටහන (Orientation programme)	අගෝස්තු 21– 23	සියලුම සේවාවන්ට අයත් නිලධාරීන්	දින 03	52	-	දේශීය	විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම.
35	ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව (Field Visit) බ.ජ.ගු	අගෝස්තු 24	සියලුම සේවාවන්ට අයත් නිලධාරීන්	දින 01	59	-	දේශීය	ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ඒ ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
36	ගුවන් හමුදා නිලධාරීන්ගේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව	සැප්තැම්බර් 01	ගුවන් හමුදා නිලධාරීන් 31	දින 01	5	-	දේශීය	මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පිළිබඳ ගුවන් හමුදා නිලධාරීන් අවබෝධයක් ලබාගැනීම.
37	දේශ සීමා ආවේක්ෂණ ඒකකයේ හා ආගමන හා විගමන නිලධාරීන් සඳහා කැනේඩියානු ගමන් ලේඛන විභාග කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	සැප්තැම්බර් 12	බලයලත් නිලධාරීන්	දින 01	5	-	දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව බලයලත් නිලධාරීන්ගේ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම.
38	නාවික හමුදා නිලධාරීන්ගේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව	සැප්තැම්බර් 12-15	නාවික හමුදා නිලධාරීන් 45	දින 01	11	-	දේශීය	මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පිළිබඳ නාවික හමුදා නිලධාරීන් අවබෝධයක් ලබාගැනීම.
39	නවක බලයලත් නිලධාරීන් සඳහා සේවාරම්බක පුහුණු වැඩමුළුව (Induction Training)	සැප්තැම්බර් 19 - ඔක්තෝබර් 16	නවක බලයලත් නිලධාරීන් - 17	දින 17	80		දේශීය	දෙපාර්තමේන්තුවට අදළ රාජකාරි කටයුතු හඳුනා ගැනීම , රාජකාරීයේ දී පැමිණෙන අභියෝගයන්ට මුහුණ දෙන ආකාරය අවබෝධ කර ගැනීම හා මනා විනයකින් යුතුව රාජකාරි කටයුතු කිරීම.
40	රාජ්‍ය ප්‍රසම්පාදන උසස් පාඨමාලාව	සැප්තැම්බර් 26	විධායක නිලධාරීන් 01		138	-	දේශීය	අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය හා යාවත්කාලීන කිරීම
41	සංක්‍රමණිකයන් හරවා යැවීම සහ නැවත පැමිණීම කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන්	ඔක්තෝබර් 4	බලයලත් නිලධාරීන් 40	දින 01	-	-	විදේශීය (සංක්‍රමණික යන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය)	සංක්‍රමණිකයන් ක්‍රමවත්ව ආපසු යැවීම හා නැවත ඔවුන්ව භාරගැනීමේ ක්‍රියාවලිය නිසි ලෙස කළමණාකරණය කිරීම .

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
42	ෂෙන්ගන් වීසා පිළිබඳ පුහුණු වැඩසටහන		බලයලත් නිලධාරීන් 60	දින 02	-	-	විදේශීය (ස්විට්සර්ලන්තය තනාපති කාර්යාලය)	මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ බලයලත් නිලධාරීන් දැනුවත් වීම.
43	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන (Capacity Building Programme)	ඔක්තෝබර් 20—21	විධායක / මාණ්ඩලික නිලධාරීන්	දින 02	-	-	විදේශීය (සංක්‍රමණික යන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය)	SL - RCMS ක්‍රියාකාරීත්වය, ඔවුන්ගේ එදිනෙදා ක්‍රියාකාරකම්, යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා නැවත භාරගැනීමේ ගිවිසුම සහ ඒ ආශ්‍රිතව ක්‍රියාත්මකවන Protocol සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම.
44	ආගමන හා විගමන නිලධාරීන් උලෙසා ශ්‍රී ලංකිකයන් පෙරලා පැමිණීම කළමනාකරණය සම්බන්ධ සමෝධානික ප්‍රවේශයන් පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩමුළුව	නොවැම්බර් 1	බලයලත් නිලධාරීන් 40	දින 01	-	-	විදේශීය (සංක්‍රමණික යන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය)	සංක්‍රමණිකයන් ක්‍රමවත්ව ආපසු යැවීම හා නැවත ඔවුන්ව භාරගැනීමේ ක්‍රියාවලිය නිසි ලෙස කළමණාකරණය කිරීම පිළිබඳව දැනුම වර්ධනය කිරීම.
45	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන (Capacity Building Training)	නොවැම්බර් 11 - 12	මාණ්ඩලික හා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් 40	දින 02	-	-	විදේශීය (එක්සත් ජාතීන්ගේ සරණාගතය න් සඳහා වූ මහා කොමසාරිස් කාර්යාලය)	ජාත්‍යන්තර සරණාගත ආරක්ෂාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික අපයෝජනය, සූරාකෑම වැළක්වීම, පුද්ගල සන්නාමකරණය සහ වීසා හා පුරවැසි ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කිරීම.
46	බාහිර ක්ෂේත්‍රගත පුහුණුව (Outbound Training)	නොවැම්බර් 18 - 19	ගිණුම් හා සරප් අංශයේ නිලධාරීන් 40	දින 02	302	-	දේශීය	නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතති පාලනය, ආංශික සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම.
47	නවක බලයලත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් (කැනේඩියානු තනාපති කාර්යාලය)	නොවැම්බර් 21	බලයලත් නිලධාරීන් (20/20) 40	දින 01			දේශීය/ විදේශීය	කැනේඩියානු ලියකියවිලි සම්බන්ධයෙන් නවක බලයලත් නිලධාරීන් දැනුවත් වීම.

	වැඩසටහනේ නම	කාල සීමාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජන (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම් ලබාගත් දැනුම
48	මිනිස් ජවාරම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	දෙසැම්බර් 4, 5, සහ 6	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී 1	දින 03	-	-	ජාතික මිනිස් ජාවාරම් වැළැක්වීම පිළිබඳ කාර්ය සාධක බලකාය	අදාළ විෂය කාරණාවට අදාලව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යයභාර්ය පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල හා රාජ්‍ය පරිපාලන නිලධාරීන් දැනුවත් වීම.
49	Open Source Intelligence Course	දෙසැම්බර් 8	ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් / බලයලත් නිලධාරීන් 15	දින 01	18	-	දේශිය/ විදේශීය	රටට ඇතුළුවන හා පිටවන ස්ථාන හරහා සිදුවිය හැකි අනවසර සංක්‍රමණයන් ඇතුළු නිති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා තිරණ ගැනීම
50	බාහිර ක්ෂේත්‍රගත පුහුණුව (Outbound Training)	දෙසැම්බර් 9—10	මාණ්ඩලික නිලධාරීන්/ සංවර්ධන නිලධාරීන්/ කළමනාකරණ සේවා නිලධාරීන්	දින 02	310	-	දේශීය	නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතතී පාලනය, ආංශික සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම.
51	බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල අධ්‍යයන චාරිකාව	දෙසැම්බර් 12	සියලුම සේවාවන්ට අයත් නිලධාරීන් 48	දින 01	75	-	දේශීය	ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ඒ ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම.
52	විශ්‍රාම වැටුප් සකස් කිරීම ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩමුළුව	දෙසැම්බර් 15	මාණ්ඩලික නිලධාරීන්/ සංවර්ධන නිලධාරීන්/ කළමනාකරණ සේවා නිලධාරීන්	දින 01	29	-	දේශීය	විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ නිලධාරීන් දැනුවත් වීම.
53	කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන පරිපාලන හා අධ්‍යයන කාර්යයන් සඳහා වු දෑ අවුරුදු ඉංග්‍රිසි ඩිප්ලෝමාව. (දෙවැනි වසර)	-	බලයලත් නිලධාරී	-	25		දේශීය	රාජකාරිය තව දුරටත් වඩා ගුණාත්මකව ඉටු කිරීම.

07 පරිච්ජේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒසඳහා කෙටි පැහැදිළි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	-	-
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත්හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උපපත්‍රිකාපොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරි වරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	- අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	- අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	- අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒසඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	- අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	- අනුකූල නොවේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	- අනුකූල වේ	-	-
6.4	මුදල්රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	- අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂයතුළ පවත්වාගෙන තිබීම.	- අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	- අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	- අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	- අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	- අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	- අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	- අනුකූල නොවේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ සක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කරතිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	වැඩතහනමට ලක්වූ නිලධාරීන් සිටීම සහ ඇතැම් මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොණු සකස්කර අවසන් නොවීම	අයකර ගැනීමට කටයුතු කිරීම.
13	**පොදුතැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණයකර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කරතිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒසඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	- අනුකූල නොවේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	- අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	- අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	- අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	- අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	- අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	- අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	- අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒසඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	- අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	- අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම.	- අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-